81 වන කාණ්ඩය
3 වන කලාපය
(I වන කොටස)

5. සෙනසුරාදා
1968 අගෝස්තු 31

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

(අශෝධිත පිටපත)

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

විසර්ජන පනත් කෙටුම්පත, (1968-69) [එකොළොස් වන වෙන් කළ දිනය]

ශීර්ෂ 26-27 සහ 28 කාරක සභාව විසින් සලකා බලන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 81
இல. 3
(பகுதி I)

சனிக்கிழமை
31, ஒகஸ்ட் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

[redacted]டு மசோதா, 1968—69 [ஒதுக்கப்பட்ட பதினோராம் நாள்]
குழுவில் ஆராயப்பட்ட தலைப்புக்கள் 26–27, 28

---

Volume 81
No. 3
(Part I)

Saturday
31st August 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

(Uncorrected)

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 1968-69 [Eleventh Allotted Day]
Considered in Committee Heads 26-27 and 28

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

**1968 අගෝස්තු 31 වැනි සෙනසුරාදා**

*சனிக்கிழமை, 31 ஒகஸ்ட் 1968*

*Saturday, 31st August 1968*

---

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස්විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ. எஸ். சி. ஷேர்லி கொரயா தலைமை] தாங்கினார்கள்

*The House met at 10* A.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

## PAPERS PRESENTED

Report of the Ceylon Tourist Board for the period 1.5.66 to 30.9.66.—[*The Hon. J. R. Jayewardene.*]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු

## வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව : තාවකාලික සේවකයින්

அரசாங்கப் பயிர்ச் செய்கைக் கூட்டுத்தாபனம் : தற்காலிக ஊழியர்

### STATE PLANTATIONS CORPORATION : TEMPORARY EMPLOYEES

4. බී. වයි. තුඩාවේ මයා. (මාතර)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සේවයේ යෙදී සිටින්නවුන් අතර තාවකාලිකව පත් කරනු ලැබුවෝ කී දෙනෙක් සිටිත් ද? (ආ) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් මොනවාද? (ඉ) ඔවුන්ගේ තනතුරු මොනවාද? (ඊ) කෘෂිකර්මය, වාණිජය හා මුදල් පිළිබඳ දැනීම හා පුහුණුව ඇති අය බඳවා නොගෙන මේ අය සේවයෙහි රඳවා ගෙන ඉන්නේ මන්ද? (උ) මේ සම්බන්ධයෙන් අවශේෂ රාජ්‍ය සංස්ථාවන්ට වඩා වෙනස් වූ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට රාජ්‍ය වැවිලි සංස්ථාව ආශාවක් දක්වන්නේ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) அரசாங்கப் பயிர்ச் செய்கைக் கூட்டுத்தாபனத்தில் சேவை செய்பவர்களிடையே தற்காலிகமாக நியமிக்கப்பட்டுள்ளவர்கள் எத்தனை பேர்? (ஆ) அவர்களின் பெயர்களும் முகவரிகளும் யாவை? (இ) அவர்கள் வகிக்கும் பதவிகள் யாவை? (ஈ) கமத்தொழில், வர்த்தகம், நிதி ஆகியவற்றில் அறிவும் அநுபவமும் உள்ளவர்களை நியமிக்காமல் இவர்களை ஏன் கூட்டுத்தாபனம் சேவையில் வைத்துள்ளது? (உ) இவ்விடயம் சம்பந்தமாகப் பிற அரசாங்கக் கூட்டுத்தாபனங்கள் பின்பற்றும் கொள்கைக்கு மாறுபாடான கொள்கையைக் கடைப்பிடிக்க அரசாங்கப் பயிர்ச் செய்கைக் கூட்டுத்தாபனம் அக்கறை காட்டுவதேன்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) How many of the employees of the State Plantations Corporation have been appointed on a temporary basis? (*b*) What are their names and addresses? (c) What are the posts held by them? (*d*) Why does the Corporation continue to employ these persons instead of recruiting persons with a knowledge and training in agriculture, commerce and finance? (*e*) Why is is it that in this matter the State Plantations Corporation prefers to follow a policy different from that of the other State Corporations?

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා ධීවර ඇමති—ප්‍රවාහන ඇමති වෙනුවට)

*(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(*a*) Nine. (*b*) Mr. K. H. de Silva, Yahalatenne/Dippitiya State Plantation, Pujapitiya; Mr. R. N. Harris,



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඝ. පී. ද සිල්වා]
Yatawatta State Plantation, Yatawatta; Mr. W. D. L. Wimalatunge, Habarakada State Plantation, Tawalama; Mr. D. C. K. Dorairaj, Mr. S. Luxmanan, Miss. C. Singaratnam, Miss. N. Singaratnam, all of Pallekelle State Plantation, Pallekelle; Mr. A. de Zoysa, Castle Street Stores, Borella; Mr. N. S. Ranhotty, Yatawatta State Plantation, Yatawatta. (c) (i) Temporary Assistant Superintendent; (ii) Temporary Superintendent; (iii) Temporary Assistant Clerk; (iv) Temporary Accounts Clerk; (v) Temporary Assistant Clerk; (vi) Temporary Assistant Clerk; (vii) Temporary Assistant Clerk; (viii) Temporary Caret[redacted](ix) Temporary Assistant Field Officer. (*d*) (i) Mr. K. H. de Silva is employed in place of an assistant superintendent who has been interdicted. (ii) Mr. R. N. Harris is employed in place of a superintendent who is on leave, out of the Island. (iii) Mr. W. D. L. Wimalatunge is employed in place of an assistant clerk who was under interdiction, and has since been dismissed. (iv), (v), (vi), and (vii) Pallekelle State Plantation was taken over recently and until such time as permanent appointments are made, temporary appointments were made from residents of the estate. These posts have since been advertised and permanent appointments will be made shortly. (viii) Mr. A. de Zoysa is a temporary caretaker of a temporary stores. (ix) Mr. Ranhotty was temporarily employed in place of a dismissed field assistant, until a permanent appointment was made. (*e*) Does not arise, in view of (*d*) above.

## මාතර නගරයට (ස්ටේඩියම්) ක්‍රීඩාංගනයක්

## மாத்தறையில் விளையாட்டரங்கு

## SPORTS STADIUM FOR MATARA

5. තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ජනසතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මගින් මාතර (ස්ටේඩියම්) ක්‍රීඩාංගනයක් තැනීම සඳහා මාතර නගර සභාවට රු. 50,000 ක් දී ඇති බවත් මාතර රුහුණු ක්‍රීඩා සමාජය මගින් සැණකෙළියක් පැවැත්වීමෙන් රු. 60,000 ක් එකතු කොට ඇති බවත් එතුමා දන්නවාද? (ආ) මෙම ක්‍රීඩාංගනය තැනීම පිළිබඳව මාතර නගර සභාවත්, මාතර රුහුණු ක්‍රීඩා සමාජයත් අතර මතභේදයක් පවත්නා බව එතුමා දන්නවාද? (ඉ) මෙම ක්‍රීඩාංගනයේ කටයුතු ඇරඹීම මෙතෙක් ප්‍රමාද වීමට හේතුව එතුමා සඳහන් කරනවාද? (ඊ) මෙම ක්‍රීඩාංගනයේ කටයුතු ආරම්භ කරන්නේ කවදාද?

தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) தேசியமயச் சேவை, விளையாட்டு அமைச்சு மூலம் மாத்தறையில் விளையாட்டரங்கு அமைப்பதற்காக மாத்தறை நகர சபைக்கு ரூபா 50,000 கொடுக்கப்பட்டுள்ள தென்பதையும் மாத்தறை றுஹுணு விளையாட்டுக் கழகம் மூலம் “களியாட்ட விழா” நடத்தி ரூபா 60,000 சேர்க்கப்பட்டுள்ளதென்பதையும் அவர் அறிவாரா? (ஆ) இவ்விளையாட்டரங்கு அமைப்பது பற்றி மாத்தறை நகரசபைக்கும் மாத்தறை றுஹுணு விளையாட்டுக் கழகத்திற்குமிடையில் கருத்துவேற்றுமை நிலவுவதை அவர் அறிவாரா? (இ) இவ்விளையாட்டரங்கை ஆரம்பிப்பதற்குக் காலம் தாழ்த்தியதற்கான காரணத்தை அவர் குறிப்பிடுவாரா? (ஈ) இவ்விளையாட்டரங்கு அமைக்கும் வேலை எப்போது ஆரம்பமாகும்?

asked the Minister of Nationalised Services: (*a*) Is he aware that the Ministry of Nationalised Services and Sports has granted Rs. 50,000 to the Matara Urban Council for the construction of a Sports Stadium at Matara and that the Ruhunu Sports Club of Matara has collected Rs. 60,000, being proceeds of a carnival they had organised? (*b*) Is he aware that there is a difference of opinion between the Matara Urban Council and the Ruhunu Sports Club in regard to the construction of this stadium? (*c*) Will he state the reason why the commencement of work of the Stadium has been delayed so far? (*d*) When will the work on the Stadium commence?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු වී. ඒ. සුගතදාස (ජනසතු සේවා ඇමති)

(கௌரவ வீ. ஏ. சுகததாச—தேசியமய சேவை அமைச்சர்)

(The Hon. V. A. Sugathadasa—Minister of Nationalized Services)

(*a*) Yes. The Ruhunu Sports Club's collection was a sum of Rs. 51,423. (*b*) No. (*c*) Delay in the commencement of construction was due to delay in preparation of Estimates. (*d*) The Urban Council has now got the plan drawn by an Adviser-Engineer. The council has informed the Ministry that construction will begin shortly.

## අයි. පී. සිල්වා මහතා සහ වැඩ තහනම් කර ඇති අනිකුත් දුම්රිය කම්කරුවන්

## திரு. ஐ. பி. சில்வாவும் ஏனையோரும் வேலை இடைநிறுத்தப்பட்ட புகையிரதத் தொழிலாளர்

## INTERDICTED RAILWAY WORKERS: MR. I. P. SILVA AND OTHERS

2. තුඩාවේ මයා. (ආචාර්ය එන්. එම්. පෙරේරා—යටියන්තොට—වෙනුවට)

(திரு. துடாவ—கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை—சார்பாக)

(Mr. Tudawe—on behalf of Dr. N. M. Perera—Yatiyantota)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රත්මලාන දුම්රිය කම්කරු සමිතියේ සාමාන්‍ය සාමාජිකයින් වන සේවා අංක 60448—අයි. පී. සිල්වා, 60449—එච්. ඇල්. අමරප්‍රේම, 60456—ඒ. ඒ. සිරිසේන යන සේවක මහතුන්ගේ සේවය මේ දක්වා තහනම් කර ඇති බව එතුමා දන්නේද? (ආ) මෙම සේවක මහතුන් තිදෙනාගේ සේවය තහනම් කර දැනට වසර දෙකකුත් මාස දෙකක් ඉකුත්වීත් චෝදනා පත්‍රයක් එල්ල කිරීමට හෝ නැවත සේවයට කැඳ වීමට හෝ දුම්රිය දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇති බව එතුමා දන්නේද? (ඉ) එතුමා ඊට හේතු සහ වගකිවයුත්තන් සඳහන් කරන්නේද? (ඊ) මෙම සේවකයින් සඳහා මේ දක්වා අර්ධ වැටුප් ගෙවීමට කොපමණ මුදලක් වැය කර තිබේද? (උ) දුම්රිය දෙපාර්තමේන්තුව වැඩ ප්‍රමාදවීම නිසා ඇතිවන පාඩුව සේවකයින්ගෙන් අයකර ගන්නා බව එතුමා දන්නේද? (ඌ) එසේනම් මෙම මුදල වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට ක්‍රියා කරන්නේද? (එ) මෙම සේවකයින් ඉක්මණින් සේවයෙහි යෙදවීමට එතුමා ක්‍රියා කරන්නේද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) இரத்மலானை புகையிரதத் தொழிலாளர் சங்கத்தின் சாதாரண அங்கத்தவர்களான திரு. ஐ. பி. சில்வா (பதவியினர் எண் 60448), திரு. எச். எல். அமரபிரேம (பதவியினர் எண் 60449), திரு. ஏ. ஏ. சிறிசேன (பதவியினர் எண் 60456) ஆகியோர் வேலையிலிருந்து இடைநிறுத்தப்பட்ட நிலையில் இன்னும் இருப்பதை அறிவாரா? (ஆ) இடை நிறுத்தஞ் செய்யப்பட்டு 2 வருடங்களும் 2 மாதங்களும் சென்றபோதிலும் புகையிரதப் பகுதி இம் மூவருக்கும் குற்றச் சாட்டுத் தாள்களை வழங்கவுமில்லை, மூவரையும் மீண்டும் வேலைக்கமர்த்தவுமில்லையென்பதை அறிவாரா? (இ) இதற்குக் காரணங்களையும் யார் பொறுப்பாளியென்பதையும் கூறுவாரா? (ஈ) அரைச் சம்பளமாக இதுவரை இவர்களுக்குக் கொடுக்கப்பட்ட மொத்தத் தொகை என்ன? (உ) வேலை தாமதப்படுவதினால் நட்டத்தைத் தொழிலாளரிடமிருந்து புகையிரதப் பகுதி அறவிடுவதை அறிவாரா? (ஊ) அங்ஙனமாயின், மேற்கூறிய பணத்தைப் பொறுப்பானவரிடமிருந்து அறவிட நடவடிக்கை எடுப்பாரா? (எ) இம்மூன்று தொழிலாளர்களையும் மீண்டும் வேலைக்கமர்த்துவதற்கு வேண்டிய நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Communication: (*a*) Is he aware that Mr. I. P. Silva (staff number 60448), Mr. H. L. Amaraprema (staff number 60449) and Mr. A. A. Sirisena (staff number 60456) who are ordinary members of the Ratmalana Railway Workeres' Union are still on interdiction? (*b*) Is he aware that the Railway Department has neither reinstated these three ptrsons nor served charge sheets on them despite the fact that two years and two months have elapsed since their interdiction? (*c*) Will he state the reasons for this and also state who is responsible? (*d*) What sum of money has been paid out so far as half-pay to these persons? (*e*) Is he aware that the Railway Department recovers from its workers the loss arising as a

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුමාරසූරිය මයා.]

result of work being delayed? (*f*) If so, will he take action to recover losses from those in fact responsible for them? (*g*) Will he take action to reinstate these three workers without delay?

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා විදුලිබල ඇමති හා සභානායක) වෙනුවට)

(*கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்—போக்குவரத்து அமைச்சர்—சார்பாக*)

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries—on behalf of the Minister of Communications)

(*a*) Mr. I. P. Silva and Mr. H. L. Amaraprema have since been reinstated. Mr. A. A. Sirisena is still under interdiction. He was involved in MC. 28125/C and has since been acquitted. The court record has been called for and a final decision will be made thereafter. (*b*) Does not arise in view of the answer to (*a*). (*c*) The delay was due to the fact that there were two M.C. cases in which three persons were involved. The case records had to be obtained and examined before a final order was made. (*d*) The amount paid to these three employees as half-pay and other allowances during the period 7.2.66 to 31.7.68 is Rs. 12,377.46. (*e*) No. (*f*) Does not arise. (*g*) Does not arise in view of Answer to (*a*).

## කෙලවල්ලන් අල්ලන බෝට්ටු මිලදී ගැනීම සඳහා ටෙන්ඩර්

*ரியுனு தோணிகள் வாங்கும் கேள்விப்பத்திரங்கள்*

## TENDERS FOR THE PURCHASE OF TUNA BOATS

3. ආචාර්ය එන්. එම්. පෙරේරා

(*கலாநிதி என். எம். பெரேரா*)

(Dr. N. M. Perera)

කර්මාන්ත හා ධීවර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කෙලවල්ලන් අල්ලන බෝට්ටු මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් කැඳවා තිබේද? (ආ) එසේ නම්, මෙම ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසාන දිනය කුමක්ද? (ඉ) මෙම ටෙන්ඩර් පත් මෙ රටට සීමා වීද? නැතිනම් විදේශවලිනුත් ටෙන්ඩර් පත් කැඳවන ලද්දේද? (ඊ) මේ ගැන උනන්දුවක් දක්වන සැම දෙනෙකුටම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට හැකි වන පිණිස විදේශයන්හි අපේ තානාපති කාර්යාලවලට අදාළ ලියකියවිලි නොයවන ලද්දේ මන්ද?

*கைத்தொழில், கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) "ரியுனு" தோணிகளை வாங்குவது சம்பந்தமாகக் கேள்விப்பத்திரங்கள் அழைக்கப்பட்டனவா? (ஆ) அப்படியாயின் இக்கேள்விப் பத்திரங்களை சமர்ப்பிப்பதற்கான முடிவு திகதி என்ன? (இ) இக் கேள்விப் பத்திரங்கள் உள்ளூரிலிருந்து அழைக்கப்பட்டனவா அல்லது உலகத்தின் பல பாகங்களிலுமிருந்து அழைக்கப்பட்டனவா? (ஈ) சிரத்தை யுடையவர்கள் எல்லோரும் கேள்விப் பத்திரங்கள் சமர்ப்பிக்கக் கூடியதாக வெளிநாடுகளிலுள்ள தூதுவராலயங்களுக்கு தகவற் சாதனங்கள் அனுப்பப் படாததேன்?*

asked the Minister of Industries and Fisheries: (*a*) Have tenders been called for the purchase of Tuna Boats? (*b*) If so, what is the closing date for these tenders? (*c*) Were these tenders called locally or were they world wide tenders? (*d*) Why were documents not sent abroad to our various Missions in order to enable all interested to submit tenders?

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන

(*கௌரவ டீ. பீ. ஆர். குணவர்தன*)

(The Hon. D. P. R. Gunawardena)

(*a*) Yes. (*b*) 10.4.1968. (*c*) Tenders were published in the local Press and tender documents were sent to the following foreign missions in Ceylon:—Australia, Belgium, Brazil, France, Netherlands, Japan, Peru, Spain, U. K. & U. S. A. (*d*) See reply under (*e*).

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සාම හමුදාවේ ඩී. රොබට්සන් මහතා**

*திரு. டீ. றொபேட்சன், சமாதானச் சிறப்பணி*

MR. D. ROBERTSON, PEACE CORPS

6. එම්. පී. ද සොයිසා සිරිවර්ධන ,මයා. (මිනුවන්ගොඩ)—(එස්. ඩී. බණ්ඩාරනායක මයා.,—ගම්පහ වෙනුවට)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ—சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. S. D. Bandaranayake—Gampaha)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සාම හමුදාවේ නියෝජිතයකු වන ඩී. රොබට්සන් මහතා ත්‍රිකුණාමලයේ වෙප්පන්කුලම්හි පිහිටි සමුප කටයුතු මොනවාද ? (ආ) මොහුගේ වැඩ කටයුතු මොනවාද ? (ආ) මොහුගේ වැඩ පිළිබඳ වාර්තාවක් එතුමා මේ සභාවට ඉදිරිපත් කරනවාද ?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) திருகோணமலே, வேப்பங்குளத்திலுள்ள கூட்டுறவு இளைஞர் பண்ணையில் சமாதானச் சிறப்பணிப் பிரதிநிதி திரு. டீ. றொபேட்சன் என்ன வேலை செய்கிறார்? (ஆ) அவரது வேலை சம்பந்தமான ஒரு பூரண அறிக்கையை அமைச்சர் இச்சபையில் சமர்ப்பிப்பாரா?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) What work is the Peace Corps representative, Mr. D. Robertson, doing in the Co-operative Youth Farm in Veppankulam in Trincomalee? (*b*) Will he table a full report of his work in this House?

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

(*a*) Mr. D. Robertson is a Peace Corps Volunteer attached to the Youth Settlement Scheme at Veppankulam in Trincomalee District. He has received training at the International Rice Research Institute. He assists the Officer and the youths in their field work. He lives in the Youth Scheme and works in the field along with the youths. (*b*) The answer is the same at (*a*) above.

**කන්තලේ ජනපද යෝජනා ක්‍රමයේ ගොවීන්ට ජලය සැපයීම**

*கந்தளாய்க் குடியேற்றவாசிகளுக்குத் தண்ணீர்*

WATER FOR KANTALAI COLONISTS

7. ද සොයිසා සිරිවර්ධන මයා.—(එස්. ඩී. බණ්ඩාරනායක මයා., වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. எஸ். டீ. பண்டாரநாயக்க—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. S. D. Bandaranayake)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කන්තලේ ජනපද යෝජනා ක්‍රමයේ ගොවීන්ට මෙම කන්නයේදී ජලය සපයා ඇත්තේ අක්කර ½ කට පමණක් බව එතුමා දන්නවාද ? (ආ) ජනපද වැසියන්ට පළමුවෙන් ජලය සපයා ඊට පසුව කන්තලේ උක් වගාවට ජලය සැපයීමට එතුමා කටයුතු යොදනවාද ?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) கந்தளாயிலுள்ள குடியேற்றத் திட்ட விவசாயிகளுக்கு இந்தப் போகத்திற்கு ½ ஏக்கர் பயிர்ச் செய்கைக்கு மட்டுமே தண்ணீர் கொடுக்கப்படுகிறதென்பதை அவர் அறிவாரா? (ஆ) கந்தளாயில் குடியேறியவர்களுக்கு முதலிலும், அதன் பின்னரே கரும்புச் செய்கைத் திட்டத்திற்கும் தண்ணீர் கொடுக்கப்படுவதற்கான ஏற்பாடுகளை அவர் செய்வாரா?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that the Peasants in the Colonization Scheme in Kantalai are given water for only ½ acre for cultivation this season? (*b*) Will he arrange to give water first to the Colonists and then to the Sugar Cultivation Project in Kantalai?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

(*a*) The peasants of the colonization scheme had been given water for one ac_e for cultivation for Yala 1968. (*b*) Water will be given to the colonists for the full extent for the Maha season and for a portion of the extent in Yala season depending on the water in the tanks available for that Yala season.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Question No. 8.

ගර[redacted]ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)
(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

I want a month's time to answer the Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## උතුරු හුරුළු පළාතේ ප්‍රා. ආ. නි. විජය අල්ගම මහතා : අල්ලස චෝදනා

திரு. டபிள்யு. வல்கம, பெ. இ. உ., ஹுருலு பலாத்த வடக்கு : இலஞ்சக் குற்றச் சாட்டுக்கள்

## MR. W. WALGAMA, D. R. O., HURULUPALATA NORTH : BRIBERY ALLEGATIONS

9. ද සොයිසා සිරිවර්ධන මයා. මෛත්‍රීපාල සේනානායක මයා.,—මැදවච්චිය වෙනුවට)
(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி—சார்பாக)
(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Maithripala Senanayake—Medawachchiya)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) උතුරු හුරුළු පළාතේ වැඩ බලන ප්‍රාදේශීය ආදායම් නිලධාරී විජය වල්ගම මහතාට විරුද්ධව අල්ලස් කොමසාරිස්ටත් එතුමාටත් උතුරු හුරුළු පළාතේ, මහජනයා විසින් චෝදනා ඉදිරිපත් කර ඇති බව එතුමා දන්නවාද? (ආ) එතුමාට ඉදිරිපත් කළ කාරණා ගැන ගත් ක්‍රියා මාර්ගය කුමක්ද? (ඉ) මෙම චෝදනා ගැන පරීක්ෂණයක් පැවැත්වීමට එතුමා කටයුතු කරනවාද? නො එසේ නම්, මන්ද?

உள்நாட்டு அமைச்சரைக் கேட்ட வினா : (அ) ஹுருலுபலாத்த வடக்கு பதிற் பெ. இ. உத்தியோகத்தரான திரு. விஜயவல்கமவிற்கு எதிரான இலஞ்சக் குற்றச்சாட்டுகள்பற்றி இலஞ்சவாணையாளருக்கும், அமைச்சருக்கும் அப்பகுதி மக்கள் முறைப்பாடுகள் செய்திருப்பதை அவர் அறிவாரா? (ஆ) அவருக்குச் செய்த முறைப்பாடுகள் மீது அவர் என்ன நடவடிக்கை எடுத்துள்ளார்? (இ) இந்தக் குற்றச்சாட்டுக்களையிட்டு அவர் விசாரணைக்கு ஏற்பாடு செய்வாரா? இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs: (*a*) Is he aware that the people of Hurulupalata North have made representations to the Bribery Commissioner and to him of charges of bribery against Mr. Wijaya Walgama, Acting D. R. O., Hurulupalata North? (*b*) What action has he taken on the representations made to him? (c) Will he cause an inquiry to be held into these allegations, if not, why not?

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

(අ) උතුරු හුරුළු පළාත වැඩ බලන ප්‍රාදේශීය ආදායම් නිලධාරි විජය වල්ගම මහතාට විරුද්ධව අල්ලස් චෝදනා ඇතුළත් කුංචුට්ටු කෝරළයේ ගම්වැසියන් වන එස්. නයිදුරාල සහ තවත් 24 දෙනෙකු විසින් අත්සන් කර මා වෙත එවන ලද 1968.6.24 දිනැති පෙත්සමක් පරීක්ෂාකොට වාර්තා කිරීම සඳහා දිසාපති වෙත යවා ඇත. පෙත්සමට අත්සන් කර ඇති අයගේ ලිපිනයන් සඳහන් කොට නැත. කෙසේ වෙතත් පරීක්ෂණ පැවැත්වෙමින් තිබේ. (ආ) (අ) අනුව පැන නොනගී. (ඉ) (අ) අනුව පැන නොනගී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 10.

ගරු ආචාර්ය දහනායක
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

I need a fortnight's time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 11.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I need time to collect the information required to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## විසර්ජන පනත් කෙටුම්පත, 1968-69

*ஒதுக்கீட்டு மசோதா, 1968-69*

APPROPRIATION BILL, 1968-69

කාරක සභාවේදී සලකා බලන ලදී.— [ප්‍රගතිය අගෝස්තු 28]

[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பெற்றது.—[தேர்ச்சி : 28 ஒகஸ்ட்] [சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

*Considered in Committee.—[Progress : 28th August].*

[MR. SPEAKER *in the Chair.*]

26 වන ශීර්ෂය.—ප්‍රවෘත්ති හා ගුවන් විදුලි පිළිබඳ අමාත්‍යවරයා

1 වන සම්මතිය :—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා රු. 16,229

*26 ஆம் தலைப்பு.—தகவல், ஒலிபரப்பு அமைச்சர்*

வாக்குப்பணம், இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூ. 16,229

HEAD 26.—MINISTER OF INFORMATION AND BROADCASTING

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 16,229*

ඉදිරිපත් කරන ලද සංශෝධනය [අගෝස්තු 28] :

"වැය ශීර්ෂය රුපියල් දහයකින් අඩු කළ යුතුය."—[බර්නාඩ් සොයිසා මයා.]

பிரேரிக்கப்பட்ட திருத்தம் [28, ஆ[redacted]:

"வாக்குப்பணம் 10 ரூபாவாகக் குறைக்கப்படுவதாக"—[திரு. பேணட் சொய்சா]

*Amendment moved.—[28th August] :*

"That the Vote be reduced by Rs. 10".—[*Mr. Bernard Soysa.*]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

ආර්. ජේ. ජී. ද මෙල් මයා. (දෙවිනුවර)
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)

Mr. Chairman, I would now come to the question of the engineering and technical side of the Ceylon Broadcasting Corporation. We feel that the loss of popularity of the overseas beams of the Ceylon Radio has been largely due to the poor transmission and the break-down in the efficiency of the engineering section of the Broadcasting Corporation.

I see in the Estimates that under Head 26, Vote 7, Economic Development, a sum of Rs. 6,300,000 has been provided as a grant to the Ceylon Broadcasting Corporation for expansion of transmitting services and studio facilities. I also note that foreign aid expenditure from the Federal Republic of Germany has been earmarked in a sum of Rs. 4,500,000.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Is the hon. Member going to take a long time? We have to finish this Head by 11 o'clock.

දි මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

Only about twenty minutes more.

I would like to find out why this preference has been given to West Germany. At the moment it is an accepted fact that probably the best radio equipment in the world comes from Japan. There are a number of other countries, both in the socialist world and amongst the Western countries, which could provide very good transmitting equipment. We are aware of the control the stranglehold that Voice of America obtained over our radio services by loaning some transmitters a few years back. I would request the Hon. Prime Minister to be careful and to ensure that to the Voice of America we do not also add the Voice of West Germany over our radio.

I am aware of the tie-up of certain officials of the engineering section with certain West German interests. We should be careful about these tie-ups if we are to preserve complete non-alignment in our broadcasting policy, and complete non-alignment in our foreign policy, which is sometimes reflected even in broadcasting policy.

පූ. භා. 10.15

I am aware that the tentacles of foundations like the Friedrich Ebert Foundation are extending over our radio and press. The Central Intelligence Agency of the United States acts in various devious ways, very often not directly but through other foundations in West Germany and so on and so forth. I am not making any allegations; I am only asking the Government to be careful of these new alignments.

I would also ask what has happened to the transmitters at Diyagama? Six new transmitters were installed in Diyagama. It was expected that these six new transmitters would provide an efficient service for the Ceylon Broadcasting Corporation; that they would even be able to take over some of the work which is now being done through the transmitters provided by Voice of America, thereby gradually freeing ourselves from the tentacles of Voice of America.

I understand that out of these six transmitters only four are functioning efficiently. I understand that two are not functioning efficiently due to various technical and other defects which can easily be rectified if the engineering section gets down to the business. I would request the Hon. Prime Minister to look into the question of the transmitters at Diyagama to see that full utilization of these transmitters is effected.

There is a certain amount of waste, confusion and incompetence in the engineering section of the Ceylon Broadcasting Corporation, which is probably the most incompetent side, the weakest link in the whole broadcasting chain. I would request the Government to start a scheme of reorganization in the engineering section, where there are certain very efficient officers who are now not given a chance to show their skill. I remember one Mr. Buell. He is an excellent engineer, but I know that he was never given a chance to prove his work and mettle in the radio service.

Then I would come to the parennial question of Voice of America. Voice of America still continues to function over the Ceylon Broadcasting Corporation. There was an old provision in the agreement with the U. S. Government that the Ceylon Government reserves the right to vet and control all broadcasts done over our radio station by Voice of America. This condition is normally fulfilled in the breach. This vetting was never done properly. I know it was not done

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

properly even in my time because the question of vetting all programmes over a broadcasting station, as the hon. Parliamentary Secretary will agree, is a very difficult thing. In actual practice it is very difficult to fulfil. But now I understand that Voice of America transmits its programmes not from Torrington Square, as they used to do, but from Seeduwa, which makes it still more difficult. In the olden days Voice of America transmitted their programmes from the main station in Torrington Square. There was a certain amount of control and a certain minimum amount of vetting at that time. But now that Voice of America has shifted its headquarters to Seeduwa, I understand that Voice of America has become a law unto itself.

These are small matters, probably trivial matters, but these small matters sometimes can prejudice our policy of complete non-alignment in foreign relations.

I remember the time in the old days when sometimes the Ambassador of the Soviet Union, or the Ambassador of the People's Republic of China or even the High Commissioner for India used to come charging to Radio Ceylon to tell me that certain broadcasts had gone over the Voice of America Programme which were prejudicial to their interests and which prejudice our policy of complete non-alliance in foreign affairs. The Voice of America broadcasts are a dangerous thing and the sooner we get rid of this Voice of America canker, this running sore in our broadcasting organization, the better it is or this country. I think it would be a good day both for broadcasting and our policy of non-alignment.

I remember the Prime Minister asked me last time why I did not do this in my time. I gave him the answer then. I made a very strong recommendation when I was Director-General of Broadcasting that either we should cease this Voice of America broadcast—it is a small matter, a few million rupees—or we should extend the same facilities to all other countries, which would make the situation worse confounded.

I would also request the Hon. Prime Minister to give us some sort of guarantee that although the Voice of America broadcast transmission has shifted to Seeduwa, some type of vetting of those programmes will take place in the future to preserve our policy of non-agignment in foreign affairs.

Then there is this question of outside recording by advertising agents and private firms in the Commercial Service and its sponsored programmes. All this work which is now done in private firms can well be done by the Ceylon Broadcasting Corporation and revenue can be earned by the Ceylon Broadcasting Corporation by doing its work within its own studios if the engineering section were to function efficiently.

I would also refer to a racket which is said to have occurred in the Comercial Service of the Broadcasting Corporation on its Tamil and Hindi beams. I would read an article in this connection which apeared in the "Sun" and in certain other newspapers. It is headlined :

"Joint Probe by Ceylon and Madras Police—Millions raked in Film-Radio Racket."

It goes on to state :

"A crack police team handpicked by the I. G. P. has bared a multi-million rupee film advertising racket over the Ceylon Broadcasting Corporation during a period of ten years operated by two officers of the Corporation."

This is not something that started the other day. I am not blaming this Government in particular. This seems to have been going on for a long time.

"The investigating team comprising A. S. P. Abeywardena and Inspector Wettasinghe who returned to the Island last week, after conducting inquiries with the Madras State I. G. P., has reported to the I. G. P. that several film producers in the Madras State had been duped to the tune of lakhs of rupees on the promise

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

that their production would be publicised over the Commercial Service's Tamil medium. Sums of money ranging from Rs. 10,000 for a Tamil film and Rs. 15,000 for a Hindi film are reported to be deposited in the banks in London and Switzerland on behalf of these two officers by their agents in India.

Inquiries into this racket was sparked off following a complaint made to the Director-General, Mr. Neville Jayaweera, by the Film Producers' Guild of South India that several of its members had been asked to part with their money on the understanding that their film and track would be advertised over the air here."

Then it goes on to say at "Thevi" Films the investigating team was told that they had paid Rs. 22,000 to publicize the film "கொஞ்சும் சலங்கை" And the proprietor of "Thevar" Films has produced a receipt to the value of Rs. 15,000 and another to the value of Rs. 9,000 to publicize the film "தாய் சொல்லைத் தட்டாதே" And then they have gone on to list a large number of Tamil and Hindi films which are alleged to have been publicized and advertised over the Comercial Service of Radio Ceylon for consideration.

Now, as you know, the Commercial Service of Radio Ceylon on its All India Service, both on the Tamil and Hindi beams, gives a certain amount of free publicity for Hindi and Tamil films, for Hindi and Tamil music. No payments are charged from these film producers If such rackets had taken place an immediate investigation should be conducted. Investigations seem to have already been conducted. We would like to know the outcome. Were any officers interdicted? What do you propose to do with them? What steps do you propose to take to stop this racket? We should like to have full information about this racket which is alleged to have taken place.

I would refer again to the fact that most of these rackets can take place on the Commercial Service, Indian beam because we have only one agent in India, an agent called R. A. S.. I think R. A. S. stand for Radio Advertising Services, Bombay. R. A. S. is the sole agent for the Ceylon Broadcasting Corporation in the whole of India. Various rackets can take place when you give a monopoly right to one agent for the whole of India.

If you are really keen on developing commercial advertising in India I would suggest that you appoint agents in Calcutta, Delhi, Madras and in various other cities in India. That is what you must do if you want to derive the full benefit from your Commercial Service in India.

I also wish to touch very briefly on the Information Department. The hon. Member for Colombo South raised the question of a brochure which has been published on "The City within a City". As for me, I love to see the energetic and amiable hon. Parliamentary Secretary; he is really very good seeing. I love to hear him; he is very good listening to. I am prepared to accept *in toto* the explanation he offered in this House that he was not responsible for this publication.

In this connexion I would wish to refer to a matter of general principle without making any allegations against anybody. I am accepting your assurance *in toto* that you were not responsible for this publication. A Government has the complete right to use its propaganda channels for advertising its achievements. It was always the fault of our Government that we did not use our radio and our Information Department effectively enough to propagandize or publicize whatever we were doing for the people for this country whether it be in industry, agriculture or food production and so on. A Government has every right to do so. But as in the case of arts where there is the old maxim *ars est celare artem*—in good art you must conceal art—in good publicity too you must conceal publicity. Good propaganda must be

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

subtle to be effective. A Government must not think that it can use its radio organization or its Information Department to advertise its achievements as it advertizes tooth paste for example. That is the one fault of the publicity and propaganda campaign that is going on now.

I understand that in the Information Department provision was made in the last year's Estimates to recruit five additional press officers and three information officers. The posts of press officer were advertized in the newspapers in October 1967 and interviews were held in November. I understand that recommendations were made for their appointment but no appointments have been made so far. I stand to correction if my information is not correct. But I should like to know why no action has been taken for the appointment of the information officers and why the advertisement stipulated that only graduates should apply. For information work, for publicity work, for radio work, it is not necessary to recruit graduates only; it is not necessary to recruit Civil Servants only. I am sure that men with a flair for publicity work can do this work much better than some graduates. I should like to know what happened to these interviews and why no officers have been selected.

I would also draw your attention to the Administration Report of the Department of Information which states that the expenditure on Information in Ceylon is .1 per cent of the annual national budget. In the United Kingdom it is .37 per cent, whilst in Malaysia it is .6 per cent of the total annual expenditure of the Government. In India where the State gets also vote funds for Information the expenditure by the Central Government is .175 of the Union Budget.

When you look at these facts and figures, it would appear that we are not spending enough on this department, and in this context it is not understood why even those posts which were advertised have not been filled up to date.

I think I have taken up some time in my comments on the Ceylon Broadcasting Corporation and on the Information Department. These comments were given in a spirit of constructive criticism of both these departments. I was particularly constrained to mention about the board of directors once again. I have nothing against planters. In fact, as I told you, I think agriculture is the most congenial occupation, and if I retire from politics one day that is the one occupation I would like to go back to. If you find a planter I think you should appoint him to the State Plantations Corporation.

ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)

*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

Who is the planter ?

දි මෙල් මයා.

*(திரு. டி மெல்)*

(Mr. de Mel)

One Mr. Hassim a planter.

ගරු ඩඩ්ලි සේනානායක

*(கௌரவ டட்ளி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

He is not a planter, he is an Advocate practising in Kegalle.

දි මෙල් මයා.

*(திரு. டி மெல்)*

(Mr. de Mel)

If you appoint an industrialist—I understand that you have a good maker of jams and jellies in the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]
Corporation—you should appoint him to the Canning Corporation or to the cannery. It is this Jingbang of jam makers, this curious assortment of planters and hackwriters——

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
Who is the industrialist ?

පූ. භා. 10.30

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)
One Mr. Perera who is a jam maker. I heard he is a very good jam maker.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
He is a business man, I thought.

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)
He should be appointed to the cannery. He is a very good jam maker. It is this sort of thing that I object to. I have nothing against this gentleman.

I shall now conclude my observations on these two departments. It is in a spirit of constructive criticism that I have brought forward my suggestions.

ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදූව)
(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)
(Mr. Prins Gunasekera—Habaraduwa)
ගරු සභාපතිතුමනි, ගරු අගමැතිතුමා යටතේ පාලනය වන දෙපාර්තමේන්තු දෙකක් ගැන කරුණු සවල්පයක් ප්‍රකාශ කරන්නටයි මා නැගී සිටියේ. මේ දිනවල මන්ත්‍රණ සභාවේ දෙපැත්තේම සිටින නායකවරුන් අදහස් පළ කිරීමේ නිදහස ගැන එකඟත්වයකට පැමිණ තිබෙන බවක් පෙනෙනවා. ගරු අගමැතිතුමා ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන තිබෙන එම අදහස—ප්‍රතිපත්තිය—ජාතික වශයෙනුත් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

පසුගිය දිනවල විදේශීය සඟරා කිහිපයක් ලංකාවට ගෙන්වීම තහනම් කිරීම ගැන මේ මන්ත්‍රී මණ්ඩලයේදී ප්‍රශ්නයක් නැඟු බව ගරු අගමැතිතුමා දන්නවා ඇති. මට මතක හැටියට ඒ ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ ගරු රාජ්‍ය ඇමතිතුමා විසිනුයි. මා මේ සඳහන් කරන්නේ චීන ජන රජයෙන් නිකුත් කරන "පීකිං රිවිව්" නමැති සඟරාව ගැනයි.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
What he is speaking about has nothing to do with this Vote.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
එම සඟරා ගෙන්වීම අගමැතිතුමාගේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත් කරුණක්ය යන විශ්වාසය උඩයි මා කතා කළේ.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்டலி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
The hon. Member is speaking about magazines coming from foreign countries. That is a matter that comes under the Customs Department.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
රාජ්‍ය ඇමතිතුමා වෙන්න ඇති මේ සඟරා ගෙන්වන්නෙ.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
The hon. Member can raise it under Finance.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

හොඳයි, මා ඒ අවස්ථාවේදී මේ ගැන කතා කරන්නම්. මා අදහස් කළේ මේ සඟරා ආදිය ගෙන්වීම අයත් වන්නේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට කියායි. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත් වැය ශීර්ෂය යටතේ කථා කරන අවස්ථාවේදී මා ඒ ගැන සඳහන් කළේ ඒ නිසයි. මෙය ප්‍රවෘත්ති, තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ ප්‍රශ්නයක් නිසයි, මේ අවස්ථාවේදී ඒ ගැන සඳහන් කළේ. කෙසේ නමුත් මා ඒ ගැන පසුව සඳහන් කරන්නම්. ගරු සභාපතිතුමනි, යම් යම් ප්‍රවෘත්ති දැන ගැනීමේ නිදහස පිළිබඳ කාරණයක් ගැන ගරු අගමැතිතුමාගෙන් දැනගැනීමටයි මා බලාපොරොත්තු වුණේ.

ගරු අගමැතිතුමාගේ අනික් දෙපාර්තමේන්තුව නම් ගුවන් විදුලි දෙපාර්තමේන්තුවයි. ගුවන් විදුලිය මගින් ආණ්ඩුවේ ප්‍රචාරයක් හැටිය අද ගෙන යන්නේ වගා ව්‍යාපාරය ගැන කරුණු සඳහන් කිරීමයි. ස්වදේශීය අංශයේ හෝ වේවා, වෙළඳ අංශයේ හෝ වේවා, හැම වැඩ සටහනක්ම අගදී අපට අසන්න ලැබෙන්නේ රජය මගින් මෙහෙයවන මහා සටනක පතාක යෝධයින් පිළිබඳ ආරංචි රැසකුයි. එම සිද්ධිය හැම විටම සඳහන් කරන්නේ පැරකුම් යුගයේ එක්තරා වීරයෙක් පිළිබඳ ආරංචියක් දෙන ආකාරයටයි. "දැනට මෙහෙයවන වගා සටනේ එක්තරා පරාක්‍රමයක් දුන් අහන්න. අඳවල් පළාතේ අසවල් ගොවි මහතා නැත්නම් වීරයා මේ තරම් ප්‍රමාණයක් අස්වැන්න ලබා තිබෙනවාය" ආදී වශයෙන් කියනවා. ගරු සභාපතිතුමනි, මෙය එක්තරා විධියකින් දෛවය විසින් මේ රජයට ලබා දී තිබෙන නාමයක් වෙන්න ඕනෑ. පැරකුම් යුගය බිහි කරනවාය යන්න කොයි විධියට ලබා ගත් එකක්ද? පැරකුම් යුගය සමහරුන් විශ්වාස කරන අන්දමට සිංහල සාහිත්‍යයේත් ඒ වගේම ලංකාවේ ආර්ථික සංවර්ධනයේත් ඓතිහාසික යුගයක් හැටියට සලකනවා. නමුත් සමහර ඉතිහාසඥයින් පැරකුම් යුගය ඒ තරම් අගය කොට සලකන්නේ නැහැ. මක්නිසාද? ඒ පැරකුම් යුගය අවසාන වනවාත් සමගම මේ රටේ සිංහල රාජධානියේ පරිහානියත් දෙමළ බලයේ සංවර්ධනයත් ඇති වූ නිසයි. එමනිසා සමහරුන් මේ පැරකුම් යුගය එතරම් අගය කොට සලකන්නේ නැහැ. මේක දෛවය විසින් නියම කරන ලද්දක්ද කියා මා දන්නේ නැහැ. වර්තමාන ගරු අගමැතිතුමාගේ නායකත්වයෙන් බිහි කරන්නට යන පැරකුම් යුගයත් අන්න එවැනි පැරකුම් යුගයක් බව මට පෙනී යනවා. ඒ මුල් පැරකුම් යුගයෙන් පසු මේ රටට උදාවූ ඒ අවාසනාවන්ත ඉතිහාසය වැනි ඉතිහාසයක් මේ නූතන පැරකුම් යුගයෙන් පසුවත් උදාවෙනවාය කියා ගරු අගමැතිතුමා කියන්නේ නැහැ. නමුත් එතුමා මෙහෙයවන මේ ප්‍රචාරක ව්‍යාපාරයෙහි නිතරම සඳහන් වන්නේ පැරකුම් යුගයක් ගැනයි.

ගරු සභාපතිතුමනි, පසුගියදා විශ්‍රාම ගත් විනිශ්චයකාරතුමකු මේ රටේ පැරණි සිංහල සිරිත් විරිත් හා නීති ගැන පොතක් ලියා තිබෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කවුද?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ආචාර්ය එච්. ඩබ්ලිව්. තම්බයියා.

ඒ පොත ගන්න මා පොත් සාප්පුවකට ගිහින් එහි තිබූ අනෙකුත් පොත් පත් දෙසත් ටිකක් බලාගෙන යන විට තවත් එවැනිම පොතක් මට දකින්නට ලැබුණා. මා ගියේ උගත් දෙමළ සාහිත්‍යධරයකු විසින් සිංහලයන් ගැන ලියන ලද පොතක් මිලදී ගැනීමටයි. ඒ පොත සමගම දෙමළ මහත්මයකු විසින් ලංකාවේ පැරණි දෙමළ වර්ගයා ගැන ලියන ලද පොතකුත් ඒ රාක්කයේ තිබුණා. "The Tamils in Early Ceylon" නම් මේ පොතේ කර්තෘවරයා සී. සිවරත්නම් නම් මහත්මයකුයි. ඒ මහත්මයා පැරණි වෛද්‍යවරයකු බවයි පෙනෙන්නෙ. ඒ මහත්මයාගේ "The Tamils in Early Ceylon" නම් මේ පොතේ, "පැරණි ලංකාවේ දෙමළ වර්ගයා" නම් මේ පොතේ, කීප ස්ථානයකම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

පැරකුම් යුගය ගැන සඳහන් කර තිබෙනවා. ඒ මහත්මයාගේ, නැත්නම් ඒ ඉතිහාසඥයාගේ අදහස් අනුව පැරකුම් යුගය කියන්නේ ලංකාවේ දෙමළ වර්ගයාගේ ඉතාම විශිෂ්ඨතම යුගයයි. ඊළඟට පොළොන්නරු යුගය හඳුන්වන්නේ දෙමළ වර්ගයාගේ සම්බන්ධය නිසා මේ රටේ ඇති වූ ඉතාම සෞභාග්‍ය සම්පන්න යුගය හැටියටයි. පොළොන්නරුව පැරකුම් යුගයේ මධ්‍යස්ථානයයි; රාජධානියයි. සිව රත්නම් මහත්මයා තම ග්‍රන්ථයේ පොළොන්නරුව හඳුන්වා තිබෙන්නේ මෙහෙමයි:

"Polonnaruwa is the name of a historic city hallowed in the memory of the ancient Tamils."

ගරු අගමැතිතුමාත් මේ මතය පිළිගන්නවාද කියා මා දන්නේ නැහැ. නමුත් එතුමා දෙමළ මිත්‍රවරුන් හා අත්වැල් බැඳ ගෙන එතුමාගේ නායකත්වයෙන් ගෙන යන මේ ජාතික රජය යටතේ දෙමළ වර්ගයා වෙනුවෙන් නිකුත් කරන ලද පොත්වල සඳහන් වන්නේ එහෙමයි. සමහර විට මේක නරක අනාගතයක පෙර නිමිත්තක් වෙන්නට පුළුවනි. මා දන්නේ නැහැ. පොළොන්නරුව ගැන සඳහන් කර තිබෙන මේ ඡේදයේ තවත් ලක්ෂණ කථාවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, පසුගිය දවස්වල දිස්ත්‍රික් සභා පනත් කෙටුම්පත පිළිබඳව ඇති වූ විවාදයේදී දෙමළ රාජ්‍ය පක්ෂයේ අය කර තිබෙන ප්‍රකාශයක් මට මේ අවස්ථාවේ දී මතක් වෙනවා. අප මේ ආණ්ඩුවට ඇතුළු වුණේ පිටවෙන්නට නොවෙයි, අත පිසදා ගෙන නිකම් එළියට බසින්නට නොවෙයි කියා එතුමන්ලා කියා තිබුණා. එවැනිම අදහස් කීපයක් පොළොන්නරුව ගැන වර්ණනා කරමින් මේ ග්‍රන්ථයටත් ඇතුළු කර තිබෙනවා. 35 වන පිටුවේ මෙහෙම කථාවක් තිබෙනවා: "පරාක්‍රමබාහු රජතුමාට ලංකාව පාලනය කිරීමට දෙමළ සේනාංකවල නැත්නම් දෙමළ යුද්ධ හමුදාවල ප්‍රයෝජනය ලබා ගැනීමට සිදු වුණා." දෙමළ රාජ්‍ය පක්ෂයේ ආධාරය ලබා ගෙන මේ ආණ්ඩුව පවත්වාගෙන යෑමට නමුන්නාන්සේට සිදු වුණා වාගේම මහා පරාක්‍රමබාහු රජතුමාටත් දෙමළ හමුදාවන්ගේ සහයෝගය ලබා ගෙන රටේ පාලනය ගෙන යෑමට සිදු වුණාය, කියා මෙහි සඳහන් කර තිබෙනවා. ඉතින් යුද්ධය අවසාන වුණා. දෙමළ හමුදා මේ රටේ සිටිනවා. ඊළඟට ඒ මිනිසුන්ට මාස්පතා ගෙවන්නට ඕනෑ; කෑම බීම, ඉඳුම් හිටුම් දෙන්නට ඕනෑ. මොකද වුණේ? බරපතළ ප්‍රශ්නයක්. එවැනි ඓතිහාසික පසුබිමක් තිබුණු අවස්ථාවේදී තමයි මාඝ කියන මනුෂ්‍යයා ඇවිත් ඒ පොළොන්නරු යුගය කාබාසිනියා කර දමා අපේ වටිනා සාහිත්‍යය විනාශ කර දැමුවේ. නමුන්නාන්සේලා වර්ණනා කරන ඒ පැරකුම් යුගයෙන් පසුව තමයි පොළොන්නරුව අද මේ තිබෙන නටබුන් තත්ත්වයට වැටුණේ. ගරු අගමැතිතුමා යටතේ ගුවනින් බිහි කරන්නට යන පැරකුම් යුගයත්, එදා ඉතිහාසයේ බිහිව තිබූ අද නෂ්ඨාවශේෂ පමණක් දක්නට ලැබෙන පැරකුම් යුගයත් අතර අපට මේ කියන සමානත්වය දකින්නට ලැබෙනවා. ගරු අගමැතිතුමනි, අද නමුන්නාන්සේගේ රැකවරණය ලැබ මේ රටේ බොහෝ තැන්වල බලයට පැමිණ සිටින දමිළ ජනයා කියන්නේත් එදා පැරකුම් යුගයේ සිටි දමිළ ජනයා කිව්ව දේමයි. මේ පොතේ 35 වෙනි පිටුවේ මෙහෙම තිබෙනවා:

"*Mun vaccha kal, pin vaika matane*", meaning, "the foot which had been placed in front will not be taken back by me."

එහි තේරුම, "ඉදිරියට තැබූ අඩිය අපි පස්සට ගන්නෙ නැහැ" කියන එකයි. එදා ඒ පරාක්‍රමබාහු රජතුමා යටතේ යම් යම් කාර්යයන් සඳහා ලංකාවට ගෙන්වා ගනු ලැබූ දමිළ ජනයා කියනව, ඉස්සරහට තැබූ අඩිය අපි පස්සට ගන්නෙ නැහැ කියා. ඒ වගේම අද ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය කියන්නෙත් "අපි ජාතික ආණ්ඩුවට ඇතුල් වුණේ නිකම් හිස් අතින් ගෙදර යන්ට නොවෙයි" කියායි. ඒ විතරක් නොවෙයි, මේ පොතේ 39 වෙනි පිටුවේ රාජාවලියෙන් කොටසක් ඉදිරිපත් කරල මේ විධියට කියනවා:

...."that Magha settled Tamils in every village". He quotes again Rajaratnakara which records that even before Magha's times, in the 9th and 10th centuries, the domination of the Tamils was so complete that they were in large numbers in every town and village throughout the Island."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද අප මුහුණපා සිටින්නෙත් එබඳු තත්ත්වයකට දැයි ගරු අගමැතිතුමා ටිකක් කල්පනා කර බලන්න. තව තවත් ගුවන් මගින් මේ පැරකුම් යුගය බිහි කරන්නට උපදෙස් දෙන්නට පෙර පැරණි පැරකුම් යුගයත්, නැවත වරක් ගුවන් මගින් බිහි කරන්නට යන නූතන පැරකුම් යුගයත් අතර මේ වගේ සම්බන්ධයක් තිබෙනවා දැයි ටිකක් කල්පනා කර බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගුවන් මගින් ගෙන යන මේ ප්‍රචාරය නිසා සමහර උදවියට නම් පෞද්ගලික ලාභ ප්‍රයෝජන ලැබෙන බව හැබැයි. දැන් පවතින විධියට රජයේ වැඩ කටයුතුවලට, රජයේ අදහස්වලට, රජයේ ප්‍රතිපත්තිවලට මඳකින්වත් වෙනස් අදහස් දරන කිසිවෙකුට ගුවන් විදුලියෙන් ඒ අදහස් පළ කිරීමේ අයිතියක් නැහැ. ගිය සතියේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡාවට භාජනය වෙද්දී විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව රාජ්‍ය ඇමතිතුමා කථා කළ දවසේ, රාත්‍රී 9 ට ගුවන් විදුලිය මගින් ප්‍රචාරය කර හැරි ප්‍රවෘත්ති ප්‍රචාරයට මට හදිසියේ කන් දෙන්නට ඉඩක් ලැබුණා. පාර්ලිමේන්තුවේ පැවති විවාදය පිළිබඳව එදා ප්‍රවෘත්ති ප්‍රචාරයේ සඳහන් වුණේ එකම එක කාරණයක් ගැන පමණයි. ගරු රාජ්‍ය ඇමතිතුමා චෙකොස්ලෝවේකියාවේ රුසියන් ආක්‍රමණය පිළිබඳව ඉතා වටිනා කථාවක් කළ බව පමණයි. ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රී මණ්ඩලයේ එදා සිදු වුණේ එපමණක්ද? එදා රෑ 9 වෙන්ට පෙර පළාත් පාලන සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමා මම හිතන්නෙ මා කළ කථාවකට බැන්න. එතුමා ඊට සාක්ෂි දරනවා ඇති. ගරු රාජ්‍ය ඇමතිතුමා චෙකෝස්ලෝවේකියානු සිද්ධිය සම්බන්ධයෙන් විනාඩි 45 ක් විතර වටිනා කථාවක් කළා. එතුමාගේ කථාවට පිළිතුරු වශයෙන්,

> “ ඔබා දෙනු පරහට, තමා සම්මතෙහි පිහිටා සිට දුසිරිත් දනත් දෙන, ඔබා වැද්දත් දෙසන බණ මෙන ”

යන පාඨය අනුව අනුන්ට උපදෙස් දෙන්නට පෙර තමන් ඒ උපදෙස් පිළිපැදිය යුතු යයි මා කියා සිටියා. මා ඒ කථාව කර ගෙන යන අවස්ථාවේදී මූලාසනයේ ඔබතුමා නොව ඔබතුමාගේ නියෝජ්‍ය කථානායකතුමායි. ඒ අදහස් හුවමාරුව ආණ්ඩු පක්ෂයට කොයිතරම් රිදුනාදැයි කිව්වොත් එක් පාර්ලිමේන්තු ලේකම්වරයකු සමග අපේ ඉදිරිපෙළ අසුන්ගෙන සිටින අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාට (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) මිනිත්තු 15 ක් තරම් බරපතළ වචන හුවමාරුවක යෙදෙන්ටත් සිදු වුණා. ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කථාවට මා පිළිතුරු දෙන අවස්ථාවේදී ආණ්ඩුව පක්ෂයට කොයිතරම් රිදීමක් ඇති වුණාද කිව්වොත් ඒ කථාවේ තිබුණ අඩුපාඩුකම් ගෙනහැර දැක්වීමේදී විරුද්ධ පක්ෂයත් ආණ්ඩු පක්ෂයත් අතර බරපතල වචන හුවමාරුවක් සිදු වුණා. එපමණක් නොවෙයි, පළාත් පාලන උප ඇමතිතුමා මා කළ කථාවට පිළිතුරු දෙන්නට නැඟී සිට පැය එකහමාරක් තිස්සේ කෙළේ පිළිතුරු දීම නොවෙයි; පෞද්ගලිකව බැණීම එකයි. සමහර විට එය උප ඇමතිතුමාගේ විවාද ස්වරූපය වෙන්න පුළුවන්. එතුමා මගේ බඩේ පටියක් බඳින්න හැදුවා; කටේ පටියක් බඳින්න හැදුවා; ඔළුවේ පටියක් බඳින්න හැදුවා. කොහේවත් බැඳගන්න බැරුව මොනව මොනවාදෝ කියාගෙන ගියා.

එපමණක් නොවෙයි, සභාපතිතුමනි, එදා රාත්‍රී ප්‍රචාරය වූ ගුවන් විදුලි ප්‍රවෘත්තිවලට අනුව එදා මෙම මන්ත්‍රී මණ්ඩලයේදී සිදුවී ඇත්තේ රාජ්‍ය ඇමතිතුමා විසින් අදහස් දැක්වීම පමණයි. ඒ කථාවට පිළිතුරු වශයෙන් කිසිම අදහසක් විරුද්ධ පක්ෂයෙන් දැක් වී නැහැ. නම් ගම් කිව්වෙ නැතුවාට කමක් නැහැ. ගුවන් විදුලියෙන් මගේ නම ප්‍රචාරය කරන්න ඕනෑය කියා මා කියනවා නොවෙයි. එහෙත් විරුද්ධ පක්ෂයෙන් පිළිතුරු වශයෙන් ඉදිරිපත් වුණ අදහස්වත් දැක්වීම යුතුකමක් බවයි මා පෙන්වා දෙන්නෙ. ඒ අදහස් ආණ්ඩුවට කොයිතරම් අම්හිරිදි කිව්වොත් පැය එකහමාරක් තිස්සේ ඒ අදහස්වලට පිළිතුරු දෙමින් කථා කළ උප ඇමතිතුමා කෙළේ කථිකයාගේ තර්කවලට පහර ගැසීම නොවෙයි, කථිකයාට පෞද්ගලිකව පහර ගැසීමයි. එදා රාත්‍රී 9 ට නිකුත් වූ ගුවන් විදුලි ප්‍රවෘත්තිවල ඒ තර්ක විතර්ක පිළිබඳව කිසිම සඳහනක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

මේ කාරණය ගැන මා දිගින් දිගට සඳහන් කරන්නේ සභාපතිතුමනි, ගුවන් විදුලි ප්‍රචාරක කටයුතුවලදීත්, වැඩසටහන්වලදීත් ආණ්ඩුවේ අදහස්වලට විරුද්ධ කිසිම දෙයක් පළ කිරීමට ඉඩක් නැති බව පැහැදිලි කර දීමටයි. මෙය එක ආණ්ඩුවකට පමණක් නැඟිය හැකි දෝෂාරෝපණයක් නොවෙයි. සෑම ආණ්ඩුවකටම වැළඳෙන රෝගයක් වෙන්න පුළුවන්. ඒ සම්බන්ධ මගේ පෞද්ගලික අත්දැකීමක් මම ඉදිරිපත් කරන්නම්. 1956යේ බලයට පැමිණි ආණ්ඩුවේ එක්තරා කාල සීමාවකදී ආණ්ඩුවට විරුද්ධ දේශපාලන අදහස් දරණ ඇතැම් ගුවන් විදුලි ශිල්පීන් සම්පූර්ණයෙන්ම අයින් කර දැම්මා. මා එවකට පාර්ලිමේන්තුවේ සිටියේ නැති නමුත්, එවකට ආණ්ඩු බලය ලබා සිටි මහජන එක්සත් පෙරමුණේ සම ලේකම්වරයකු හැටියට හිටියා. කාලයක් ඇවෑමෙන් මහජන එක්සත් පෙරමුණු රජය කැඩී ගියා. ඉතුරු වුණේ බණ්ඩාරනායක මැතිතුමාගේ පක්ෂයෙන් සමන්විත වුණ ආණ්ඩුව් පමණයි.

ඔය වෙනස් වීම ඇති වන අවස්ථාවේදී මා ගුවන් විදුලි ශිල්පියකු හැටියට ජාත්‍යන්තර ප්‍රවෘත්ති පිළිබඳ විදේශ විත්ති විචාරය යනුවෙන් එක්තරා සතිපතා වැඩ සටහනක් පවත්වාගෙන ගියා. ලංකාවේ සිද්ධීන් ගැනවත් නොවෙයි; මේ රටේ දේශපාලන සිද්ධීන් ගැනවත් නොවෙයි. ලෝකයේ සිදු වන දේවල් ගැන සති පතා කළ විචාරයක් පමණයි. එහෙත් එදා බලයේ සිටි ආණ්ඩුවත් අපත් අතර දේශපාලන වශයෙන් මත භේදයක් ඇති වූ විගසම සතිපතා ඉදිරිපත් කරමින් තිබුණ මගේ ඒ වැඩ සටහනට තහනම් නියෝගයක් නිකුත් කළා. එයින් පෙනී යනවා ඇති සභාපතිතුමනි, මෙය ආණ්ඩු බලයේ සිටින හැමෝගේම ඔළුවට වදින අදහසක් බව. විරුද්ධ අදහස් දරණ කිසිම කෙනෙකුට ඉඩක් දෙන්නේ නැහැ. ආණ්ඩුව කියන විධියටම කථා කරන, හැසිරෙන, කන, බොන, නටන අයට පමණයි ගුවන් විදුලියේත් ප්‍රත්‍රවලත් ඉඩ ලැබෙන්නේ.

අද ගුවන් විදුලියේ සෑම වැඩසටහනක්ම භාර දී තිබෙන්නේ කාටද කියා ටිකක් සොයා බලන ලෙස—එම ප්‍රශ්නය කෙරෙහි මා ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. තමුන්නාන්සේලාගේ පක්ෂයට, තමුන්නාන්සේලාගේ වැඩ කටයුතුවලට, තමුන්නාන්සේලාගේ අදහස් උදහස්වලට, පාර්ලිමේන්තුවේදී වේවා, වෙනත් ස්ථාන ආයතනවලදී හෝ වේවා, ආවඩන අයට පමණයි. තමුන්නාන්සේලා ජාත්‍යන්තර සිද්ධීන් පිළිබඳව, සඳහන් කරනත්, නිදහස් අදහස් හුවමාරු කිරීමේ වටිනා මිනිස් අයිතිය පිළිබඳව සඳහන් කරනත්, මේ රටේ සිටින, කලාවේදීන්ට, චින්තකයන්ට, ලේඛකයන්ට ඒ නිදහස නොදෙන්නේ ඇයි? ගුවන් විදුලි ශිල්පීන් හැටියට තමන්ගේ නිදහස් අදහස් පළ කිරීමට දේශපාලන අදහස් නොවෙයි, තමන් දරණ දේශපාලන අදහස් කුමක් වුවත් යම් යම් කලාත්මක විද්‍යාත්මක විෂයයන් පිළිබඳ ඔවුන්ගේ අදහස් පළ කිරීමට—නිදහස දෙන්නේ නැත්තේ ඇයි? රුසියානුවන් චෙකොස්ලොවෙකියාවට පහර දුන් විට තමුන්නාන්සේලා නැගිට බලවත් සේ කනගාටු වෙනවා, ස්වකීය නිදහස් අදහස් පළ කිරීමේ නිදහස චෙකොස්ලොවෙකියාවට දෙන්න ඕනෑය කියා. රුසියන්කාරයින් චෙකොස්ලොවෙකියාවේ නිදහසත් නිදහස් අදහස් පළ කිරීමේ අයිතියත් පාගා හරිනවාය කියන තමුන්නාන්සේලා මෙහි සිටින මේ අහිංසක කලාකාරයින්ට කරන්නෙත් ඒකම නේද?

සභාපති
(அக்கிராசனர்)
The Chairman)

How long will the hon. Member take? The discussion has to be completed at 11.30 A.M. and there other hon. Members from the Opposition to speak; the Hon. Prime Minister has also to reply.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එහෙනම් මම වාඩිවෙන්නම්.

සභාපති
(அக்கிராசனர்)
The Chairman)

No. I am only explaning.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එහෙනම් ගරු රාජ්‍ය ඇමතිතුමාගේ අදහස් සම්බන්ධ කර කථා කරන්න මට පුළුවන්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

එහෙම බැහැ. [බාධා කිරීමක්] මා ඒවාට උත්තර දෙන්නේ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එක්තරා කරුණක් ගැන ගරු අගමැතිතුමාට කියන්න උත්සාහ කළාම එතුමා කිව්වා ගරු රාජ්‍ය ඇමතිතුමාට කියන්නය කියා.

**ගරු ඩඩ්ලි සේනානායක**
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

නැහැ. මම එහෙම කීවේ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ගරු මන්ත්‍රීතුමා බජට් එක කියවලා නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එහි කියවන්නට දෙයක් නැහැ. එය අනුමත කරන්නට පමණයි තිබෙන්නේ.

ගුවන් විදුලිය ගැන මා දිගින් දිගට සඳහන් කළේ ඇයි කියා කියන්නම්. එහි අභ්‍යන්තරව කෙරෙන පාලන කටයුතු ගැන පෞද්ගලිකව දැනීමක් මට නැහැ. ගුවන් විදුලියෙන් නිකුත්වන ඒ හඬ ඔස්සේ ටිකක් කල්පනා කර බලන විට අභ්‍යන්තරයේ ඒ තරම් සතුටුදායක තත්ත්වයක් නැති බව පෙනී යනවා. ගුවන් විදුලියෙන් හැම විටම ඇහෙන්නේ ආණ්ඩුවේ අදහස් පමණක් නම්, ගරු අගමැතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව නිතරම වර්ණනා කිරීම නම්, සිතීමේ හා අදහස් පැවසීමේ මානුෂික නිදහසට ගුවන් විදුලි මධ්‍යස්ථානයෙන් තැනක් නොලැබෙන බව අපට පැහැදිලියි. මේ රටේ මහජනතාවට අවබෝධ කර දිය යුතුව ඇත්තේ පැරකුම් යුගය ගැන පමණක් නොවෙයි. උදුවන්නට යන පැරකුම් යුගය ගැන පමණක් නොවෙයි උදා කළ යුතු කාවන්තිස්ස යුගයක් නැත්නම් දුටුගැමුණු යුගයක් ගැනත් අවබෝධයක් දෙන්නට ඕනෑ. කාවන්තිස්ස යුගය වගා ව්‍යාපාරය අතින් ලංකාව ඉහළම තැනට ගිය යුගයයි. ඒ නිසා ගරු අගමැතිතුමා යටතේ බිහි වන පැරකුම් යුගයට පෙර කාවන්තිස්ස යුගයක් බිහි වේවා කියා ප්‍රචාරය කරන්නය කියා ගුවන් විදුලියට උපදෙස් දෙන්න.

ලංකා ඉතිහාසය අනුව පැරකුම් යුගයට පසුව උදා වුණේ දඹදෙණි යුගයයි. එයට මේ රජය කැමැත්තක් නොදක්වන නිසා—ඒ ගැන කථා කරන්නට කැමති නැති නිසා—පැරකුම් යුගය ගැන වැඩිපුර කථා නොකර කාවන්තිස්ස යුගයක් ගැන හෝ දුටුගැමුණු යුගයක් ගැන ප්‍රචාරය කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

The hon. Parliamentary Secretary brought out a point which needs some comment. It is customary for hon. Members of this side of the House to criticize officials, but they never come across an occasion where an hon. Parliamentary Secretary gets up on the floor of this House and makes a broadside on his own officials. It is an interesting parliamentary point because what is the defence that this poor man has? Under all parliamentary procedures one would assume that the correct thing is for the Government to defend. Government cannot hide behind an official's

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

alleged misdeeds in order to defend itself from attack. That is not a correct thing to do.

I remember, in this House I had occasion as Minister of Finance, with great reluctance no doubt, to complain about a Permanent Secretary even on political grounds. It had nothing to do with administration. But here you are criticizing an officer immediately under you for his administrative work. I do not know; I am not prepared to take sides. It is possible that this officer is inefficient, incompetent and all the other things that the hon. Parliamentary Secretary said. But he must take the necessary steps outside. He cannot come here and defend himself on the ground.

The hon. Parliamentary Secretary cannot get up here and say that all the pictures that appeared were taken without his permission. All these pictures that appeared were his pictures. I am informed that 250 pictures were taken. Surely the hon. Parliamentary Secretary must have done that for some purpose. I am not trying to defend that officer. I am not interested in that officer. All that I am saying in that the principle you have adopted is wrong. It makes it rather difficult for us also if every Minister gets up here on the Floor of this House and says, "What can I do? My officials are bad; that man is so bad and so incompetent", and so on. Where do we come in? The whole purpose of this is to see that the Minister is responsible for his department. He must answer for his good deeds as well as his bad deeds. With regard to the bad deeds he must take appropriate action through his department. Otherwise debate in this House will become quite meaningless.

With regard to broadcasting itself, I must say I was really disappointed. I am one of the few people who listen to the radio fairly regularly during my spare time. After Parliament is over I get in to an easy chair and listen to the radio. I must say the English we hear is very poor. Apart from one person I can think of, Mr. Mark Anthony Fernando who is a fairly old hand, the pronunciation of the others is terrific. They kill the King and the Queen!—[*Interruption*]. I do not know who they are. But they cannot pronounce especially Sinhala proper names. They mess up Sinhala names. I do not think it was so bad in the past.—[*Interruption*].

For $3\frac{1}{2}$ years you could not achieve the results. All I am saying is that you should raise the standard. Consider the propaganda that is being done. I do not want to believe that I have any personal grudges against the person called Ratnakara. I know that people with the knowledge of economics have refused to go to the same panel with him. It is a disgrace. I do not know how he got into the University at all. Apart from that, the economic howlers that come out in the kind of propaganda that you do is not worthy of your Government. For instance, your saying that there is no devaluation and that one hundred cents make a rupee, and that coming from a so-called lecturer of the university is not up to the standard that we expect.

පූ. භා. 11

I must say that I think the quality of broadcasting has come down considerably partly because you are now concentrating so much on propaganda for political purposes and you are forgetting the desirability of maintaining high standards in broadcasts. During the strike period they actually announced over the radio that with the money wasted it would have been possible to construct 12 Gal Oyas! Howlers of that type are broadcast. Can one imagine that you have propaganda of that sort?

In point of fact if you read yesterday's Magazine Edition of the "Ceylon Observer" you would have seen an article on Master Premadasa. Apparently, popular songs with a romantic tilt must give way to *waga*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

gee of the Hon. Parliamentary Secretary. How can you order people to do these things?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Love songs in the spring only.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That period has passed for the Hon. Minister of State and me.

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)
(Mr. Leslie Goonewardene—Panadura)

We are now in the autumn.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Consider even some of the figures that are given in your propaganda broadcasts. In point of fact, I took them down. The estimate of the paddy production for the Maha season was 60 million bushels.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

No.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is your propaganda. I do not think the Hon. Prime Minister knows. I do not think the Hon. Prime Minister would have tolerated such false propaganda being made over the radio, because he would know that false propaganda would do him no good. But that is the type of thing done in order to please the propagandists. That is why I say that quality has been thrown overboard in order to meet the purely political purposes you have.

I do think that a greater control should be exercised over this institution. You should at least choose some reasonably outstanding men to give broadcasts.

Sometime back I litened to a resume on foreign affairs. I do not know who was giving the broadcasts, but it was a rehash, an utterly meaningless statement about foreign affairs, about what is happening in interntional affairs. Please get hold of reasonably qualified people to make these broadcasts. There are people in this country who are capable of producing a fairly intelligent resume of what is happening in the rest of the world. Do not get these second-hand nonetities to give these broadcasts.

I must say that I was very glad when we had a series of broadcasts on scientific matters. There was a very good broadcast on cancer. Now, that was very useful and very instructive. There was a similar one on T.B. That is the kind of think we shall welcome. Outstanding medical men in this country could be induced to give scientific talks of that kind. There were also a series of broadcasts on cloud formation—very useful and very instructive talks. I liked that. But please try to maintain that quality. You can maintained that quality because we have in this country qualified men. Only, choose the correct men instead of choosing men for the purpose of political propaganda.

ටී. බී. ඉලංගරත්න මයා. (කොලොන්නාව)
(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)
(Mr. T. B. Ilangaratne—Kolonnawa)

නැගී සිටියේය.

எழுந்தார்.

*Rose.*

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

I should like to mention that the time to be given to speakers from the Opposition was fixed by the Opposition. The Prime Minister has got to reply now.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

I do not intend to take long, Sir. Most of the Government members are taking a quite a lot of time this year.

මේ සම්බන්ධව මා කථා කරන්නට බලා පොරොත්තු වන්නේ වචනයක් දෙයක් පමණයි. සාමාන්‍යයෙන් ප්‍රවෘත්ති හා ගුවන් විදුලි දෙපාර්තමේන්තුව හැම අවුරුද්දේම විවේචනයට භාජන වෙනවා. කුමන ආණ්ඩුවක් තිබුණත් එම දෙපාර්තමේන්තුව විවේචනය වීම සිරිතක්. ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය රජයට බර වී ක්‍රියා නොකළ යුතුයයි මා කියන්නේ නැහැ. කුමන ආණ්ඩුවක් බලයට ආවත් මේ අංශය රජයට නැඹුරුව පාවිච්චි වීම සිරිතක්. එහෙත්, එසේ කිරීමේදී එයින් ජනතාවත් විශේෂයෙන්ම කුඩා දරුවනුත් නොමඟ නොයන ලෙස කටයුතු කිරීම රජයේ යුතුකමක්. අද ගුවන් විදුලියෙන් ප්‍රචාරය වන සමහර සංඛ්‍යා ලේඛන ආදිය දෙස බලන විට, ඇතැම් අය ජනතාව නොමඟ යන විධියට ගුවන් විදුලිය පාවිච්චි කරන බව අපට පෙනී යනවා. මේ අංශය භාර ඇමතිතුමා හෝ උප ඇමතිතුමා හෝ එතරම් දුරට පිරිහී සිටිනවායයි මා හිතන්නේ නැහැ. හැම ආණ්ඩුවකම පන්දම් කාරයන් සිටිනවා. ඔවුන් ඕනෑවට වඩා ආණ්ඩුව සතුටු කිරීමේ අදහසින් ආණ්ඩුවේ අනුමැතිය නැතිව පවා නොයෙක් ප්‍රචාරයන් සඳහා ගුවන් විදුලිය පාවිච්චි කරනවා. එයින් අප පරෙස්සම් විය යුතුයි.

මේ ආණ්ඩුවේ වගා ව්‍යාපාරය සම්බන්ධයෙන් ගුවන් විදුලියෙන් කෙරෙන ප්‍රචාරය බොහෝදුරට විවේචනය වන බව අප දන්නවා. ප්‍රචාරය කෙරෙන ඉලක්කම් කිසිසේත් සත්‍ය ඒවා නොවෙයි. 1964 වී අස්වැන්න පිළිබඳ ඉලක්කම් ප්‍රචාරය කෙරෙන්නේම නැහැ. 1964 වී අස්වැන්න බුසල් ලක්ෂ 501 ක් පමණ තිබුණා. ගුවන් විදුලි ප්‍රචාරකයන් ඒ ගැන කිසිවක් සඳහන් කරන්නේ නැහැ. ඔවුන් ප්‍රචාරය පටන් ගන්නේ 1965 දී ලැබුණු බුසල් ලක්ෂ 437 නුයි. ඊළඟට, "දැන් මෙපමණ වී අස්වැන්න වැඩි වී තිබෙනවාය" ආදී වශයෙන් කියාගෙන යනවා. අසත්‍ය ප්‍රකාශ කරන විට මිනිසුන් නොමඟ යනවා. වගා ව්‍යාපාරය අතින් මේ ආණ්ඩුව සෑහෙන වැඩ කොටසක් කර තිබෙන බව අප පිළිගන්නවා. ජනතාව ධෛර්යමත් කිරීමට ඒ පිළිබඳ සත්‍ය තත්ත්වය ප්‍රචාරය කිරීම හොඳටම සෑහෙනවා. අසත්‍යය ඊට මිශ්‍ර කළ විට සත්‍ය කොටසවත් ජනතාව පිළිගන්නේ නැහැ. එවිට එය විවේචනය කරන්නට අපට සිදු වෙනවා. නොයෙක් ප්‍රශ්න අහන්නට සිදු වෙනවා. ඒවාට පිළිතුරු දෙන්නට රජයට සිදු වෙනවා. අද පාසැල් සිසුන් බොහෝ දෙනකු ගුවන් විදුලියට කන් දෙනවා. ඔවුන්ට අප ඇත්ත කිව යුතුයි. වී අස්වැන්න පිළිබඳ කරුණු ප්‍රචාරය කරන විට දැනට වඩා පරිස්සම් විය යුතුයි. වී අස්වැන්න පිළිබඳ ගණන් හිලවු ලබා ගන්නේ එක්කෝ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන්, එසේ නැත්නම්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන්. මේ සංඛ්‍යා ලේඛන සකස් කෙරෙන ආකාරය ගැන ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය ටිකක් මීට වඩා කල්පනාකාරී විය යුතුයි. හේවාහැට එක ස්ථානයක වී අස්වැන්න පිළිබඳ සංඛ්‍යා ලේඛන හැදූ හැටි මා දන්නවා. ඒ අනුව මට ඒ පිළිබඳ කරුණු කියන්නට පුළුවනි. කුඹුරක යාර 20 ක් හෝ 60 ක් හෝ දිග පළල ඇති කොටසක් වෙන් කොට, වී අස්වැන්න ගණන් බලන්නේ එම කොටසේ අස්වැන්න අනුව බව ගොවියාට දැනුම් දෙනවා. ඒ ගොවියාට සමහර විට අක්කර 2, 3 ක හෝ 4, 5 ක කුඹුරු තිබෙන්නට පුළුවනි. එහෙත් අස්වැන්න ගණන් බලන්නේ වෙන් කරන ලද කොටසෙන් පමණයි. එම නිසා, ඒ කොටසේ වී කරල් හැකි තරම් ලොකු කර ගන්නට ගොවියා ඔහුගේ මුළු බලයම යොදවනවා. ඉන් පසු, අස්වනු කපන දිනයේදී නිලධාරියකු පැමිණ එම කොටසේ ඇති ලොකුම වී කරලක් කඩාගෙන එහි ඇට ගණන් කරනවා. ඒ කුඹුරු යායේම අස්වැන්න ගණන් බලන්නේ ඒ එක වී කරලේ ඇට ගණන අනුවයි. සමහර විට ඒ අනුව, මුළු දිස්ත්‍රික්කයේම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වී අස්වැන්න ගණන් බලනවා. එම නිසා, වී අස්වැන්න පිළිබඳ සංඛ්‍යා ලේඛන සකස් කෙරෙන ආකාරය ගැන මීට වඩා විමසිල්ලෙන් කටයුතු කරන ලෙස මා රජයෙන් ඉල්ලා සිටිනවා.

ගුවන් විදුලිය භාරව සිටින නිළධාරි තුමා ගැන මා මීට කලිනුත් කරුණු සඳහන් කළා. නිතරම ගොවි ගී ඉදිරිපත් කරන ලෙස ඔහු ගුවන් විදුලි ගායක යන්ට නියම කරනවා. දැන් ඒ ගොවි ගී ගායනය ප්‍රමාණය ඉක්මවා ගිහින්. සමහර ගී මිහිරියි. එහෙත් ඇතැම් ගී දැන් අමිහිරි තත්ත්වයට පත්ව තිබෙනවා. ගුවන් විදුලි ගායක ගායිකාවනුත් ප්‍රචාරකයනුත් ගුවන් විදුලිය ඔවුන්ගේ ජීවිකාව සලසා ගැනීමේ මාධ්‍යය කරගෙන සිටිනවා. ඒ ගැන අප ඔවුන්ට දොස් කියන්නේ නැහැ. යම්කිසි කොන්දේසි ඇති කළ විට ඒ අය එම කොන්දේසි අනුව ක්‍රියා කළ යුතුයි. එසේ ක්‍රියා කළේ නැත්නම් ඒ අයට එම වැඩය ලැබෙන්නෙ නැහැ. ඒ නිසා සිද්ධ වෙලා තියෙන්නෙ මොකක්ද? ගොවි ගීවලින් සියයට 60 ක් පමණම අමිහිරි ඒවා වී තිබෙනවා. එකම වචන කියාගෙන කියාගෙන යනවා. ඒ නිසා එම ප්‍රචාරය එකම විහිළුවක් බවට පත් වී තිබෙනවා. මොරිස් දහනායක මහත්මයාගේ ලිපිය මා ඉදිරිපත් කළා. ලියුම් හුවමාරුවක් තිබුණා. එය වාර්තාගත වී තිබෙනවා. ඒ ඒ ගායක ගායිකාවන්ට, නළු නිළියන්ට ගොවිතැන් කටයුතු සම්බන්ධයෙන්ම ගී කියන්නට කොයි තරම් කාලයක් ගත කරන්නට නියම කර තිබෙනවාද යන්න එයින් පෙනෙනවා. එහි විපාකය කුමක්ද? බොරු කරන්නට බැරි නිසා, සමහර ජනප්‍රිය අයට ගුවන් විදුලිය පාවිච්චි කරන්නට අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. එමනිසා දැනට අනුගමනය කරන ප්‍රතිපත්තිය හුඟක් දුරට වෙනස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කළ යුතු තවත් කාරණයක් තියෙනවා. එනම් ගමනක අවසානය නමැති චිත්‍රපටිය සම්බන්ධවයි. එය මැරිච්ච මනුෂ්‍යයකු සම්බන්ධව තිබෙන චිත්‍ර පටියක්. බණ්ඩාරනායක අගමැතිතුමා දිවංගත වී අවසානයි. එතුමා සම්බන්ධයෙන් කළ යුතු ප්‍රචාරය මේ චිත්‍රපටිය නැතුවාට ගෙන යන්නට පුළුවන්. එහෙත් මේ චිත්‍ර පටිය පෙන්වන ලෙස—විශේෂයෙන් ගුණානුස්මරණ උත්සව වලදී පෙන්වන ලෙස—මිනිසුන් ඉල්ලා සිටියොත් ඊට ඉඩකඩ සලසන ලෙස මා ගරු අගමැතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මේ සඳහා වියදමක් යන්නේ නැහැ. මා හිතන පිළිවෙළට ඒ චිත්‍ර පටිය කාර්යාලයේ තිබෙනවා. එය විනාශ කර දැම්මාද දන්නෙ නැහැ. මේ ආණ්ඩුව පත් වූ හැටියෙම දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමාගේ පින්තූර ආදිය—බස්වල, කාර්යාලවල තිබුණු පිළි රූ ආදිය—විනාශ කර දැමූ බව ආරංචියි. මේ ඓතිහාසික චිත්‍රපටියට එවැනි ඉරණමක් අත් වුණේ නැත කියා අප කල්පනා කරනවා. බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනයේදී මෙය පෙන්වන ලෙස යම් කෙනකු ඉල්ලා සිටියොත්, විශේෂයෙන් ගුණානුස්මරණ සභාව ඉල්ලා සිටියොත්, කරුණාකර ඊට ඉඩ දෙන ලෙස මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ ගණන් හිලව් දෙස බලන විට තවත් කරුණක් පෙනෙනවා. ගුවන් විදුලි ප්‍රචාරක සේවය හා ප්‍රචාරක මැදිරි පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ලංකා ගුවන් විදුලි සංස්ථාවට ආධාර වශයෙන් රුපියල් ලක්ෂ 63 ක් වෙන් කර තිබෙනවා. ආර්ථික සංවර්ධනය සඳහායි, මේ මුදල වෙන් කර තිබෙන්නේ. මේ තරම් විශාල මුදලක් වැය කරන පිළිවෙළ කුමක්ද කියා අප දැන ගන්නට සතුටුයි. ගුවන් විදුලි ප්‍රචාරක සේවය සඳහා විදේශ ආධාර වශයෙන් ජර්මනියෙන් ලක්ෂ 45 ක් ලබා ගන්නට යන බව මෙහි සඳහන් කර තිබෙනවා. විදේශ විනිමය මේ තරම් හිඟ කාලයේදී මේ තරම් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් මේ සඳහා වැය කළ යුතුද කියා අප විස්තර දැන ගන්නට සතුටුයි. ඒ සම්බන්ධයෙන් අවවාද කරන්නට අපට පුළුවන්කමක් නැහැ. නමුත් මේ සම්බන්ධව සොයා බැලුවොත් හොඳයි.

අය වැය ඇස්තමේන්තුවේ ඕ. 5 දරණ පිටවේ සඳහන් කර තිබෙනවා, 1967-68 වර්ෂයේ අනිකුත් කාර්ය මණ්ඩල වශයෙන් 99 දෙනකු සිටි බව. 1968-69 වර්ෂය සඳහා ඒ ගණන 134 ක් කර තිබෙනවා—35

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
කින් වැඩ කර තිබෙනවා. ඒ වැඩ කිරීම සම්බන්ධව යම් විස්තරයක් අපට දැන ගන්නට ලැබුණොත් හොඳයි.

අවසාන වශයෙන් කිව යුතු තවත් කරුණක් තියෙනවා. පාර්ලිමේන්තුවේ කෙරෙන කථා හා අනිකුත් වැඩ කටයුතු පිළිබඳ ප්‍රචාර පොඩ්ඩක් ආණ්ඩුවට නැඹුරුව ගෙන ගියාට අපේ විරුද්ධත්වයක් නැහැ. ඒ අතර අනික් පැත්තෙන් අදහස් ඉදිරිපත් කළොත් ජනතාවට ඇත්ත දැන ගන්නට පුළුවන් වෙයි; ගුවන් විදුලි සංස්ථාවත්, දෙපාර්තමේන්තුවත් කෙරෙහි ඒ අය තුළ ඇති විශ්වාසය තහවුරු කර ගන්නට ඒ අයට අවස්ථාවක් ලැබෙයි.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
*rose.*

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
I have mentioned before that the times have been fixed by the Opposition and it was agreed that no more time would be taken. We are agreed that we must finish this Head by 11.30 A.M.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
We will suffer, Sir, if we take more time on one item.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
I have to see that we keep to this programme.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
If the Hon. Prime Minister is willing——

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
It is not a question of his being willing. You agree to one thing and now you want to change that.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
I just need two minutes.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
We must finish this by 11.30. The hon. Third Member for Colombo Central may carry on.

පූ. භා. 11-15

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
Mr. Chairman, I do not wish to repeat what has already been said by the hon. Member for Colombo South (Mr. Bernard Soysa) and the hon. Member for Devinuwara (Mr. de Mel) regarding the need to settle at once the question of the permanency of employment of staff. I wish to refer to another aspect of it.

I am informed that a number of relief announcers and other officers who have been taken over on contract are also to be allowed to compete apparently with officers taken over from Radio Ceylon for whatever number of appointments have been fixed in the schedule at the Ceylon Broadcasting Corporation. I think we should in the first instance give preference to those persons who have been taken over from Radio Ceylon. I tmink we must give them an opportunity by which they can continue to be government servants and go to some other department if they have the necessary qualification, so that first priority should be given to these people. That was the promise given to them when they were taken over from Radio Ceylon to the

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

Corporation. I hope we will get a categorical assurance that that will be done.

I do not want to mention names but there are a number of instances of persons who are acting as relief announcers who had been discontinued from Government Service before. They had been discontinued from Radio Ceylon before this but somehow or other they have come back as relief announcers. I am not going into all these. Relief announcers are temporary appointments and if those officers are also placed on parity with the staff taken over from Radio Ceylon, I hope that the request of mine is borne in mind.
Gmdrzs.

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*
(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

ගරු සභාපතිතුමනි, ඉදිරිපත් කර ඇති ප්‍රශ්න කීපයක් සම්බන්ධයෙන් පුළුවන් තරම් කෙටියෙන් පිළිතුරු සපයන්න මා බලාපොරොත්තු වෙනවා. මේවාට පිළිතුරු සැපයීමේදී මතක් කරන්න කැමතියි, යම් යම් අදහස් විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් වුණාය කියා ඒවා ප්‍රතික්ෂේප කර දැමීමට අපේ කිසිම බලාපොරොත්තුවක් නැති බව. විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් වන ඉතාම වැදගත් අදහස් අපේ විශේෂ සැලකිල්ලට භාජන වන බව මුලින්ම කියන්න කැමතියි. දේශපාලන පාක්ෂික ප්‍රශ්නයක් හෝ ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්නයක් හෝ හැරුණු විට පරිපාලනය පිළිබඳ ප්‍රශ්නවලදී නිරන්තරයෙන්ම හැම කොටසකගේම අදහස් සලකා බැලීමට අප බලාපොරොත්තු වෙනවා. මා පළමුවෙන්ම කියන්න කැමතියි, යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මට දුන් අවවාදය එතුමා නොපිළිගත් අවවාදයක් බව.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)
නැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
හබරාදුව ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) "ඔවා දෙනු පරහට, තමා සම්මතෙහි පිහිටා සිට-දුසිරිත දනත් දෙන, ඔවා වැද්දන් කියන බණ වැනි" කියන කියමන ගැන සඳහන් කළා. ඇත්ත වශයෙන්ම යටියන්තොට මන්ත්‍රීතුමාටත් මෙම සිද්ධියෙහි දී ඒ කියමන මතක් කර දෙන්න කැමතියි.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමතිවරයා වශයෙන් සිටියදී, ස්ථිර ලේකම්වරයකු සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු කළ අවස්ථාවේදී—

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)
දේශපාලන වැඩ ගැන.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
දේශපාලන වැඩ ගැන; පෝය නිවාඩුව සම්බන්ධ ප්‍රශ්නයක් ගැන.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)
ඒක නොවෙයි ප්‍රශ්නය.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
ඔව්, ඒක තමයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)
නැහැ. මම එය පැහැදිලි කරන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රේමදාස මයා.**
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිවලට, ක්‍රියා මාර්ගවලට විරුද්ධව ක්‍රියා කළාය කියා එදා අගමැතිව සිටි මැතිණිය හමු වන්න තමුන්නාන්සේ ගියා නොවේද ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

තමුන්නාන්සේ කියන කාරණය ගැන නොවෙයි. ප්‍රශ්නය, දෙපාර්තමේන්තුවේ සාමාන්‍යයෙන් වැඩ කරන වේලාවේදී වෙනත් යම් යම් වැඩවල යෙදීම.

**ප්‍රේමදාස මයා.**
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

එහෙම නම් ඒක ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි; පරිපාලනය පිළිබඳ ප්‍රශ්නයක්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට විරුද්ධව, දේශපාලන බලපෑමක් වශයෙන් එම කටයුත්තෙහි යෙදුණ නිසා.

**ප්‍රේමදාස මයා.**
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

ආණ්ඩුවක ප්‍රතිපත්තියෙහි, ක්‍රියා මාර්ගයෙහි වෙනසක් කරන්න බැහැ; දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා බර්නාඩ් සොයිසා මයා.) යම් නිලධාරියකුගේ වෙනස් කිරීමක් ගැන සඳහන් කරමින් එම වෙනස්කම ඇති කිරීමට වගකිව යුත්තා මා හැටියට චෝදනා වගයක් එල්ල කළා. මේ පොත මුද්‍රණය කළ නිසාද, මේ ගැන විවේචනය කළ නිසාද—

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
(திரு. பேர்னாட் சொய்ஸா—கொழும்புத் தெற்கு)
(Mr. Bernard Soysa—Colombo South)

මා එහෙම දෙයක් කීවේ නැහැ; තමුන්නාන්සේ ඒ අන්දමට හිතා ගෙන තිබෙනවා පමණයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිට, මෙම ආණ්ඩුවෙන් වෙනත් නිලයකට පත් කළ, විශේෂ පුහුණුවක් ලබා ඇති මේ නිලධාරියා අවුරුදු තුනකට පසුව වෙනත් වැඩකට හදිසියේම මාරු කළේ මන්ද කියායි මා කලින් ප්‍රශ්න කළේ.

**ප්‍රේමදාස මයා.**
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

හේතුව මම කියන්නම්.

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பேர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

යම් කිසි කටයුත්තක් සඳහා විශේෂ පුහුණුවක් ලැබූවකු ඒ ස්ථානයෙන් වෙනත් තැනකට මාරු කිරීම වැරදි ප්‍රතිපත්තියක් බවයි මා පෙන්නුම් කර දුන්නේ.

දෙවන කාරණය, මේ පොත ගැන වග කියන්නේ කව්දැයි මා ඇසුවා. මේ අන්දමේ පොතක්, පිළිවෙත්වලට විරුද්ධ, පිළිගැනීමකට විරුද්ධ පොතක් පළ කිරීම හොඳ නැති බව පෙන්නා දුන්නා.

**ප්‍රේමදාස මයා.**
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

එම පැහැදිලි කිරීමම මගේ තර්කය සනාථ කරන්න වඩාත් ප්‍රයෝජනවත් වෙනවා. එතුමා ප්‍රශ්න කරනවා වෙනස් කළේ මන්ද කියා. යම් ස්ථානයකින් යම් නිලධාරියකු වෙනස් කරනවා නම්, මාරු කරනවා නම්, අදක්ෂතාවයට වඩා වැදගත් හේතුවක් පෙන්වන්න ඕනෑ කරනවාද? ඇත්ත වශයෙන්ම අපේ ගරු අගමැතිතුමාත් සාක්ෂි දරයි, මේ පොත ගැන විවේචනය කරන්න බොහෝ කාලයකට පෙර බව, මාරු කිරීමේ තීරණය ගෙන තිබුණේ. පොත ගැන විවේචනය කරන්න පටන් ගත්තේ මාරු කිරීම් කොලය ඇවිත් දෙපාර්තමේන්තුවෙන් යන්න සූදානම් වී, යන ගීතය ගායනා කරන කොටයි, ඇත් තමුන්නාන්සේලාට පැහැදිලි වෙනවා ඇති ඒ පුද්ගලයා තමුන්නාන්සේලාට කියා තිබෙන්නෙ සම්පූර්ණ බොරුවක් බව. මිනිහ බොරු කියන්න දක්ෂයෙක්. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා නම් සමහර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විට මිනිහ ගැන නොදන්නවා ඇති, ඒත් දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාට සපයා තිබෙන තොරතුරු සම්පූර්ණයෙන්ම බොරු.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
තමුන්නාන්සේ කීවා, ඒ පුද්ගලයා මා සමග පැයක් කථා කළාය කියා. පැයක් කථා කළේ නැහැ.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)
තමුන්නාන්සේ පැයක් කථා කළොත් ඒ මිනිහා ගැන මට වඩා කළකිරේවි. බොහොම කලින්, ඒ කියන්නෙ මාසෙත් දෙකෙන් ඔය රාජකාරියට තේරුණා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
අවුරුදු තුනක් සිටියා. තමුන්නාන්සේයි මිනිහා ඔතැනට ගෙනාවෙ.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)
ඒ නිලධාරියා ගෙනෙන ලද්දේ මා විසින් නොවෙයි. ඒ අවස්ථාවේදී මෙම අංශය අයත් වුණේ රාජ්‍ය අමාත්‍යාංශයටයි. එදා වැඩ බැලීම සඳහා තාවකාලිකව කෙනකු පත් කර ගත්තා. ඔහු වැඩ බැලූ එක නම් ඇත්තයි. ඒ මිස වැඩක් කෙළේ නැහැ.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
තමුන්නාන්සේලාගේ ආණ්ඩුව නොවැ එයා ගෙනාවේ ?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ඒ වාගේම එයාට දුන්නේ සර්ව බලධාරී නිලයක්.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)
ඒක තේන්නම්, එයා කළ වැරදි වැඩ නිසා තමුන්නාන්සේලා අපට හුඟක් චෝදනා කෙළේ. වැරදි කරන මිනිහා ඒ වැරදි කරන තැනම තබා ගත යුතුද ? වැරදි නිවැරදි කර ගන්නට ඕනෑ නැද්ද ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
වැරදි හදන්න ඕනෑ තමයි. හැබැයි, වග කීම තමන් භාර ගන්න ඕනෑ.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)
ඔව්, වගකීම භාරගෙන තමයි, ඒක කෙළේ. දැන් එයා අපේ දෙපාර්තමේන් තුවේ නැහැ.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
" තමුන්නාන්සේගේ වැඩ හොඳ නැහැ " යි ඔහුට කීවාද ? " වැරදි හරිගස්සා නො ගන්නේ මන්ද ? " යනුවෙන් ඔහුගෙන් ඇසුවාද ?

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)
ඔව්, මාත් කිව්වා. ස්ථිර ලේකම්තුමාත් කිව්වා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ඔහුගේ පිළිතුරු ඇසුවාද ?

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)
අපොයි ඔව්, එයාට පිළිතුරක් නෑ. කොහොමද පිළිතුරු දෙන්නේ ? මගේ අවසරයක් නැතුව පිංතූර ගන්නේ කොහොමද ? යනුවෙන්, ඔය යෝජනා ක්‍රමය ගැන සඳහන් කරමින් යවියන්නොට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ප්‍රශ්න කළා. ඔය යෝජනා ක්‍රම යේ හැම අවස්ථාවක් පිළිබඳවම පිංතූර ගෙන තිබෙනවා. ඔය යෝජනා ක්‍රමය ගැන පමණක් නොව හැම යෝජනා ක්‍රමයක් ගැනම එහෙමයි. මා ඒක නෑනෑයි කියන් නේ නැහැ. එහෙත් මේ පොත පළ කිරී මේදී වඩා සුදුසු විධියකට එය කිරීමට මේ නිලධාරියාට පුළුවන්කම තිබුණා. "ඔය විධි යට නොවෙයි, මේක පිළියෙල කරන්නට තිබෙන්නේ, මෙන්න මේ විධියටයි" යනු වෙන් කියන්නට එයාට පුළුවන්කම තිබුණා. ඔහුට මේ ගැන මට කියන්නට පුළුවන්කමක් තිබුණේ නැත්නම් එය නියම විධියට සකස් කරන්නට ඔහුට මාර්ගෝපදේශයක්ම තිබුණා. ස්ථිර ලේකම්තුමාට ඒ ගැන කියන්නට ඔහුට පුළුවන්කම තිබුණා. නුසුදුසු පත්‍රිකාවක් ප්‍රචාරය වන්නට යනවා නම් ඒ ගැන දැනුම් දීම ඔහුගේ යුතුකමයි. එහෙත් ඒ කිසිවක් කෙළේ නැහැ. මිනිහා කොහොම හරි පොත මුද්‍රණය කරවා ගත්තා. එය අපට දැන ගන්නට එව්වේත් ඔහු මයි. ඒ පොත නුසුදුසු එකක් බව කියැවෙන කිසි ලේඛනයක්, කිසි වාර්තාවක් නැහැ. ඉතින් මේ පුද්ගලයා නිශ්ශබ්දව සිට ඒ තනතුරෙන් මාරු කිරීමේ ලියමන යවනු ලැබුවාට පසුව, එතැනින් යන්නට ලැස්ති වී මේක විවේචනය කළා. ඒක හරි ද? ඒ නිසා මේ කාරණය සම්බන්ධයෙන් දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාට සපයා තිබෙන තොරතුරු සම්පූර්ණයෙන්ම වැර දියි. පොත ගැන වගකීම ඇත්තේ ඔහුට බව මේ පිළිබඳව ස්ථිර ලේකම්තුමා විසින් කරන ලද පරීක්ෂණයකදී හෙළි වුණා. තමන් යටතේ තිබෙන දෙපාර්තමේන්තු වක තමන් නොකැමැති නිෂ්පාදනයක් සිදු වෙනවා නම්, ඒ වාගේම ඒ ගැන තමන් නොදන්නවා යයි කියනවා නම්—එයාම සකස් කළ පොත ගැන එයාටම ඒ විධියට කියන්නට පුළුවන් නම්—මා කියන්නේ ඒ පුද්ගලයා ඒ තනතුරට සුදුසු නැති බව යි. ඕක නොකියා වෙන මොනවා කියන් නටදැයි මා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ගෙන් අහන්නට සතුටුයි. දැන් ඒ පුද් ගලයා අපට යටතේ නැහැ. එයා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ධුරයක වැඩ බැලීමටවත් නුසුදුසු බව මා කීවේ ඔන්න ඔය කියන ලද කාරණා නිසයි. යටියන්තොට ගරු මන්ත්‍රී තුමා අද මේ පැත්තේ හිටියා නම් ඔය නිල ධාරියාගේ ක්‍රියා කලාපය ගැන මීට වඩා හොඳ වචන පාවිච්චි කරමින් කථා කරනවා ඇති. පයින් ගසා දෙව්ට දමනවා යයි ස්ථිර ලේකම්වරයකු ගැන සඳහන් කරමින් එදා එතුමා කීවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඒ වෙන ප්‍රශ්නයක්.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඔය තරම් වරදක් ඒ පුද්ගලයා ඒ වේලා වේ කර තිබුණේ නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඔයිට වඩා බරපතලයි; එයා දේශපාලන වැඩ කළා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා එදා කීවේ "He should be kicked out" කියලයි. මා නම් එහෙම වචන පාවිච්චි කෙළේ නැහැ. මැද්දේගොඩ සම්බන්ධ යෙන් එවැන්නක් කීවා නම් පාර මැද තිබෙන ගොම තැම්බකට පයින් ගැසුවා වාගේ වේවි. අපේ කකුල්වලත් ගොම ගාගන්නේ මොකටද? ඒ නිසා මා නම් kicked out යනුවෙන් පාවිච්චි කෙළේ නැහැ. කෙසේ වෙතත් ඒ ගරු මන්ත්‍රීතුමා මේ පැත්තේ හිටියා නම් ඒ විධියට කියාවි.

කාරණය පිළිගන්නා බව දෙවිනුවර ගරු මන්ත්‍රීතුමා (ද මැල් මයා.) කීවා.

මට මේ කාරණය විස්තර කරන්නට සිදු වුණේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් මේ ගැන සඳහන් කළ නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

තමුන්නාන්සේ කළ වැඩේ නිසයි, මා මේ ගැන මතක් කෙළේ. එසේ නැත්නම් මා මේ ගැන සඳහන් කරන්නේ නැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

හරි වඩැක් නොවැ? මගේ ඩිපෙන්ස් එක මොකක්ද? අපට මඩ ගසන කොට නිශ්ශබ්දව ඉන්නටද කියන්නේ? දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) මගෙන් ප්‍රශ්නයක් ඇසූ වාම මා නිශ්ශබ්දව සිටිය යුතුද? ඒ නිල ධාරියාට මෙතැනට අවුත් පිළිතුරු දෙන්නට බැරි නිසාම මා නිශ්ශබ්දව සිටිය යුතුද? මා කාටවත් චෝදනාවක් කළා නම් එය වැරදියි කියමු. මා කෙළේ මගෙන් ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දීම පමණයි.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා තිලක් රත්නකාර මහත්මයා ගැන විවේචනයක් කළා. දැන් ඉතින් ඒ පුද්ගලයාට තිබෙන ඩිපෙන්ස් එක මොකක්ද? මහ ජන මන්ත්‍රීවරයකු හැටියට රත්නකාර මහතා ගැන තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නට තමුන්නාන්සේට අයිතියක් තිබෙනවා. මෙහිදී තම අදහස් ප්‍රකාශ නොකරනවා නම් වෙන කොහේදී ප්‍රකාශ කරන්නටද? එහෙත් රත්නකාර මහතා මෙහි නැති නිසා ඔහු ගැ නොකිය යුතු යයි තමුන්නාන්සේ කල්පනා කළොත්—

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අප තමයි ඒක කරන්න ඕනෑ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

එතකොට තමුන්නාන්සේලා චෝදනා කරනත්ට ඕනෑ. අප කට වසාගෙන නිකම් ඉන්නට ඕනෑ. මේක පුදුම ප්‍රතිපත්තියක් නොවැ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

තමුන්නාන්සේලා ඒ අය බේර ගන්න ඕනෑ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඊට ඉස්සර අප බේරෙන්නට එපායැ?

තිලක් රත්නාකර මහත්මයා ගැනත් සඳහන් වුණා. දෙව්නුවර ගරු මන්ත්‍රීතුමා කීවා, ඒ මහත්මයාට විශාල පඩියක් දෙන වාය කියා. එය සම්පූර්ණයෙන්ම වැරදියි.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

අනික් අයට වඩා ගෙවනවා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

තමුන්නාන්සේ ඉංග්‍රීසියෙන් කළ කථාවේ සටහනක් මා ළඟ තිබෙනවා.

"Mr. Tilak Ratnakara is being paid a very high salary and has powers of the Director-General."

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

I did not say that.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

Then the hon. Member will have to have it erased from HANSARD.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

He has powers of vetting broadcasts.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

The hon. Member said that he has the powers of the Director-General. That is not correct.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

Mr. Tilak Ratnakara is head of the Department of Economics, Vidyalankara University. He is engaged by the Ceylon Broadcasting Corporation as its economic consultant on a contract of Rs. 300 a month. This is a didiculously low figure for a consultant. The average consultation fee paid to economic advisers in other corporations is Rs. 1,000 a month.

අපේ කල්පනාවේ හැටියට ඒ මහතා මේ කටයුත්තට සුදුස්සෙක් බව අප පිළිගන්නවා. ඒ නිසායි, අපි ඔහු ඒ සේවයේ යොදවා තිබෙන්නේ.

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

ඔහුද, ඒ පිළිබඳව ලංකාවේ ඉන්න නොම්මර එකේ පුද්ගලයා.

පූ. භා. 11.30

ප්‍රේමදාස මයා
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

The Member for Devinuwara gave certain figures relating to revenue from the Commercial Service. I must say that his figures are wrong.—[*Interruption*].

The hon. Member also said that artistes are being paid the same fees as they were paid many years ago. After the Ceylon Broadcasting Corporation was formed, according to the corporation's printed budget, annual payments to artistes have been raised to Rs. 1.2 million. When the hon. Member for Devinuwara was Director-General the amount set aside for artistes' payments, according to printed Estimates, was Rs. 800,000.

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

That is not the point. The hon. Parliamentary Secretary has missed the point completely. He is talking about the total payment. What is the payment to each artiste ?

ප්‍රේමදාස මයා
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

The payment to each artiste has also increased.—[*Interruption*]. If the hon. Member is saying that we have a few favourites, that is all wrong.

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

I only said that the quantum of payment to artistes has not been increased.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

I say that each artiste is now getting more than what he was getting earlier.

The hon. Member said that the revenue from the Commercial Service has fallen from Rs. 5 million to Rs. 1 million. I deny that. The actual figures are as follows :

| | | |
|---|---|---|
| 1961-62 | .. | Rs. 3.6 million |
| 1962-63 | .. | Rs. 4.5 million |
| 1963-64 | .. | Rs. 4.0 million |
| 1964-65 | .. | Rs. 3.6 million |
| 1965-66 | .. | Rs. 3.2 million |
| 1966-67 | .. | Rs. 3.1 million |
| 1967-68 up to the end of July (the first year of the corporation) revenue has increased to | .. | Rs. 4.3 million |

We expect an all-time high this year by hitting a target of Rs. 5 million. The hon. Member for Devinuwara was Director-General in 1961-62. The fall in revenue from 1964 to 1966 was due to restrictions placed by the Indian Government on transfer of advertisement revenue to Ceylon.

Another point that the hon. Member made was that programme organizers, programme assistants, and announcers are being paid poor salaries.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දි මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

Not poor salaries. I want higher salaries for them.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

Because they are poorly paid—that is the inference. He wants higher salaries for them, because they are poorly paid.

දි මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

Their present salaries are not enough.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

In regard to announcers, the maximum has been increased from Rs. 667 (gross) to Rs. 900. Is that not enough? Are you satisfied? Programme assistants—the maximum has been increased from Rs. 797 (gross) to Rs. 900. Programme organizers—the maximum has been increased from Rs. 905 (gross) to Rs. 1,200.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

The hon. Parliamentary Secretary is talking about the increase in the maximum of the different scales. What do they get?

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

You want particulars in regard to each and every one?

දි මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

When were these increases given?

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

You did not raise that question.

දි මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

Are they effective now? That is the point.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

They will be effective from the 1st of October.

දි මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

That is what I say. They are not effective now. I am talking of the present period.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

These are things we have formulated from estimates.

Then the hon. Member for Devinuwara said that there is a peculiar service called the 'S.S.' whose members are handpicked, and he asked, "What is their special job?" Did he think it was a secret service? The letters 'S.S.' stand for Studio Service and Security Service.

These employees were recruited through the Employment Exchange by the normal process of a Selection Committee——

දි මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

Not by Balasingham?

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

Not by Balasingham. Balasingham is not an official in the Selection Committee. They were selected

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

purely on qualifications set out in the schemes of recruitment. They had to comply with the requirements.

The functions of the Studio Service are to attend to the welfare and needs of artists who come to the studios. The job of the Security Service is to ensure the security of the studios.

Sir, the hon. Member knows the position that was prevailing at Radio Ceylon. When artistes came to the Broadcasting Station, there was no one to receive them and to look after their instruments. They themselves had to look after their instruments. Now, this Service is there to help the artistes. Artistes are received there. Their instruments are taken to the studio and they are looked after in the studio. These are facilities that are given to the artistes. I hope you will agree that that is a useful service.

The job of the Security Service is to ensure the security of the Broadcasting Station.

The hon. Member for Devinuwara also said that the popularity of Radio Ceylon has fallen very badly both in India and Ceylon. That is completely untrue. From India, where we used to get 5,000 requests a day, we now have 12,000 requests a day.

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

Those postcards are manufactured inside Radio Ceylon sometimes.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

I will tell you how we obtained these figures. A British company, which carried out a survey of listenership in India this year, has reported that Radio Ceylon has a listenership there of 69 per cent. The same British company carried out a survey in Ceylon in 1966 and found that Radio Ceylon enjoyed a listenerships here of 49 per cent. A research survey by an independent research company undertaken this year has also shown that the Ceylon Broadcasting Corporation listenership has risen to 52 per cent which means that one in every two persons is listening to the C.B.C. So, this is not a postcard business ; the surveys have been conducted by competent people.

Another complaint of the hon. Member was that the equipment is antiquated. This is quite true. The equipment of the C.B.C. was installed in 1950. Even at that time it was outdated in Europe.

Our most powerful transmitter was manufactured in 1938. Spares are no longer being turned out by the manufacturers. The C.B.C. has formulated a phased programme for the replacement of the outmoded transmitters and for re-equipping the studios. The total cost of this project which is phased over three years is Rs. 12 million.

Then he spoke of a disparity in salary scales. The salary scales of employees of the C.B.C. are not the arbitrary work of the Director-General or the Board. They have been arrived at after negotiations with trade unions for one and a half years ; they have been scrutinized by the Treasury, by two Deputy Secretaries to the Treasury and the Secretary to the Treasury himself, before final approval.

Then the question of the future of the employees was raised by both the hon. Member for Devinuwara and by the hon. Member for Colombo South. The hon. Members said that the Broadcasting Department's employees feared that they may not be given posts in the Corporation. This is completely unfounded. The Hon. Prime Minister has given a categorical undertaking that every single employee of the Department will be

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

given a job in the Corporation with a 15 per cent increase in the gross salary earned by him in the Department.

දි මැල් මයා.
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

That is not the answer to my question. I pointed out the fear of some that they would not get their jobs.

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

A particular job ?

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

That is right.

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

I am coming to that. I hope the hon. Member listened to the hon. Member for Yatiyantota. He said that there were some inefficient officers in certain posts and that reorganization was necessary. If we go on placing these people in the same posts, we will not be able to do this reorganization.

We will ensure that they will be found employment and we will see to it that they will not get a salary below the salary level they are getting now. But in the reorganization, we cannot promise that they will be placed in the same posts they are in now.

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Nobody objects to reorganization. But the reorganization, if it is to avoid injustice, has to be on the basis of telling the person who is unfit that he is unfit, of giving him an opportunity of correcting himself, and then establishing the fact that he is not suitable for the particular post. But here, in the process of transition from department to Corporation, you make use of the opportunity to do exactly as the board likes.

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

The hon. Member must realize that even now it is late. For one and a half years we were negotiating with these people. We are late. This is the best opportunity that we can have to make these adjustments. They would not get salaries lower than the salaries that they are drawing now. On the contrary, they will get 15 per cent more. Our difficulty is that the posts are not corresponding in relation to the reorganization that we have.

The question, "Why must officers apply for jobs instead of being absorbed ?" was asked. "Absorption" could have been possible if the posts in the Corporation corresponded point to point with posts in the Department of Broadcasting. That is one point. But this is not so. The Corporation's structures are very different from the Department's structure, e.g., a post of Programme Assistant in the Department of Broadcasting does not appear in the C. B. C. structure. There are innumerable such instances. By asking officers to apply we enable them to apply for any job for which they are qualified. So, the assurance given by the Prime Minister will be fulfilled and honoured. There is no doubt about that.

සභාපතිතුමනි, හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) පුරුදු පරිදි හාස්‍යජනක කථාවක් කළා. ලංකාවේ වර්තමාන ඉතිහාසය වෙනස් කරන්නට කථා කරන එතුමා ලංකාවේ ඇති ඉතිහාසයත් වෙනස් කරන්නට පටන් ගෙන, පැරැකුම් යුගය හැඳින්වූයේ, මේ රට ද්‍රවිඩයන්ට යටත් වුණු, රටම විනාශ වුණු යුගයක් හැටියටයි. එතුමා ඊට සාධක සොයාගෙන තිබෙන්නේ, ද්‍රවිඩ මහත්මයකු ලියූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]
පොතකින්. උන්නැහේ උසාවියේ නඩු වලදී තර්ක ඉදිරිපත් කරන්නේත් මේ විධියටද දන්නේ නැහැ. තමාට තර්ක කරන්නට සාක්ෂියක් ඕනෑ වුණාම, තමාගේ රුචිය පරිදි කොහෙන් හෝ අතපත ගා හොයා ගන්නා, ද්‍රවිඩ මහත්මයකුගේ පොතක් හොඳයි. ඒ විධියට කොහෙන් හෝ පොතක් හොයාගෙන, අසුවල් ද්‍රවිඩ මහත්මයාගේ පොතේ මේ විධියට ලියැවී තිබෙනවා යයි කියනවා. එතුමාට වුවමනා කරන්නේ පැරකුම් යුගයේ තතු නොවෙයි. ඩඩ්ලි සේනානායක යුගය, ද්‍රවිඩ යන්ට රට පාවා දුන් යුගයක් හැටියට ඔප්පු කිරීමට හිතාගෙන, පොත් සාප්පුවල ඇවිද හොයාගත්, ද්‍රවිඩ මහත්මයකු ලියූ පොතක් ගෙනාවා. දේශීය හෝ වේවා විදේශීය හෝ වේවා ඉතිහාසඥයකු ලියූ පොතක් හොයාගන්න එතුමාට බැරි වුණා. මිට වඩා පිළිතුරක් එතුමාට දිය යුතු යයි මා හිතන්නේ නැහැ.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා), කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් (ටී. බී. ඉලංගරත්න මයා.) පිළිගන්නවා ඇති, ගුවන් විදුලි සංස්ථාව පෙම් ගී ගායනයටම වෙන් වී නැති බව. ටිකක් හිනා වන්න පුළුවන් නිබන්ධයක් පත්‍රයක තිබෙනවා, මා ඊයේ දුටුවා. ඒවා ලියන්න ඕනෑ. සතුටක් ලැබෙන එවැනි දේවල් ලිවීමට අවස්ථාවක් ලැබෙන්න ඕනෑ. විශේෂයෙන් මේ දිනවල, චෙකෝස්ලෝවැකියාව සම්බන්ධයෙන් බොහොම බරපතළ කථා අහන්නට ලැබෙන නිසා, ටිකක් විනෝදයක් භුක්ති විඳින්න පුළුවන් දේවල් ලිවීම ගැන පත්‍ර වලට ස්තුතිවන්ත වෙනවා.

මෙය මගේ ප්‍රතිපත්තියක් නොව, අප අනුමත කරන ප්‍රතිපත්තියක්. ඒ පිළිබඳ ගෞරවය ගුවන් විදුලි සංස්ථාවට හිමි වන්න ඕනෑ. කාලයක් තිස්සේ ආර්ථික අතින් පරිහානිය කරා අප ගමන් කළ නිසා, යළිත් රට නගා සිටුවන්නට අපට සිදු වී තිබෙනවා. සුළු දෙයකින් පවා අධෛර්යයට පත් වීම, ස්වාභාවිකයි. ඒ ගැන පුදුම වන්නට ඕනෑ නැහැ. දීර්ඝ කාලයක් විදේශිකයන්ට යටත්ව සිටි අප, ජාතියක් වශයෙන් නැඟී සිටින්නට වෑයම් කරන යුගයක්, මේ. විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා ආණ්ඩුවක් පිහිටෙව්වත්, අපේ ආණ්ඩුවක් තිබුණත්, අපේ යුතුකම වැටී ඇති ජාතිය නගා සිටුවීමයි. ඒ සඳහා ජනතා සිත්සතන් තුළ ධෛර්යයක් උපදවන්න ඕනෑ. ඒ සඳහා යම් යම් පියවර ගැනීම අවශ්‍යයි. ඒ උදවියගේ සිත් සතන්වලට ධෛර්ය දෙන්නට අපේ ප්‍රචාරක මාධ්‍යයෙන් අපට පුළුවන්කම තිබෙනවා නම් ඒ ගැන කිසිවකු විරුද්ධ විය යුතු නැහැ. ගද්‍යයෙන් වේවා, පද්‍යයෙන් වේවා, ගීතයෙන් වේවා, වන්නමෙන් වේවා, එම ධෛර්යය දෙන්නට පුළුවන් විය හැකියි. ඒ ගැන කිසිවකු විරුද්ධ වන්නේ නැහැ.

ලංකා ගුවන් විදුලි සංස්ථාව කියා තිබෙන්නේ කුමක්ද? ගී තුනක් ගායනා කරනවා නම් ඉන් එක ගීයකට පෙම් රසය මුසු කළාට කමක් නැහැ. අනික් ගී දෙක රට වඩන රට නගා සිටුවන ගී දෙකක් විය යුතු බව කියනවා. ඒ අනුව හොඳ ලස්සන අදහස් දෙන්නට පුළුවනි. ඉංග්‍රීසි සාහිත්‍යය ගැන ලොකු දැනුමක් ඇති යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) සහ දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) පිළිගන්නවා ඇති ඉංග්‍රීසියෙන් ලියා තිබෙන ලස්සන කාව්‍යවල මිනිසුන් උසිගන්වන, මිනිසුන් ධෛර්යමත් කරවන, අදහස් ගැබ් වී තිබෙන බව. අධෛර්ය වන්නට එපාය කියන එක ඉංග්‍රීසි සාහිත්‍යයේ බොහෝවිට ගැබ් වී තිබෙනවා. ඒ වාගේම අපේ සාහිත්‍යයෙනුත් එවැනි හැඟීම් දෙන්නට ඕනෑ. අපේ පද්‍ය රචනාවලින් සහ අපේ ගද්‍ය රචනාවලින් එවැනි හැඟීම් දෙන්නට ඕනෑ. අපේ ගීත රචනාවලටත් එම රසය මුසු කළාට ඇති වරද කුමක්ද? පෙම් ගී ගයන්නට එපායැයි කීවේ කවුද? රට වැඩෙන හැටියට පෙම් ගීයක් වුවත් ගයන්නට පුළුවනි. එසේ නැතුව එවැනි තහනමක් ඇත්තේ නැහැ. එවැනි පාලනයක් ඇත්තේ නැහැ.

පූ. භා. 11.45

අපි මේ යුගය ගැන කල්පනා කර බලමු. වැටී සිටි ජාතියක් නැඟී සිටීමට පොර බදන මෙවැනි යුගයකදී ඔවුන්ට ධෛර්යය දෙන්නට වුවමනා කරන රසය සංගීතයෙන් වේවා, කවියෙන් වේවා, රචනයෙන් වේවා, කතාබහෙන් වේවා, ලබා දෙන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඕනෑ. තමුන්නාන්සේලා වේදිකාවලට නැගුණු පසු මොනවද කියන්නේ ? මේ රට නගාසිටුවිය යුතුයි කියන එක නේද කියන්නේ ? එසේ නැතුව තමුන්නාන්සේලා වේදිකාවලට නැගුණු පසු සුන්දරියට පෙම් ගී ගයන්නේ කෙසේදැයි මහජනයාට උගන්වනවාද ? නැහැ. මේ රට නගා සිටුවීමට නම් මහන්සි වෙලා වැඩ කරන්නැයි කියනවා නේද ?

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමතිවරයා වූ හැටියේම කරන ලද කථාව ඓතිහාසික කථාවක් වන බව කියන්නට කැමතියි. එදා එතුමා කිව්වේ නැහැ, අපි ටිකක් පෙම් ගී ගයන්නට වුවමනාය කියා. එතුමා කී පළමුවන අදහස මොකක්ද ? මම එතුමාගේ කතාව අකුරෙන් අකුරට අනුමත කරනවා. [බාධාකිරීමක්] මුදල් ඇමති හැටියට. අගමැතිතුමා අගමැති හැටියටත්, මට එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්වරයා හැටියටත්, පෙම් ගීවලටම ගුවන් විදුලිය යෙදිය යුතුයයි කියන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. අපි එහෙම තහනමක් කර නැහැ. එදා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කළ කථාව මගේ වචනවලින් කෙටියෙන් කියනවා නම් මෙසේයි : "යාළුවා, දුන් සෙල්ලම් කළා ඇති ; මහන්සි වෙලා වැඩ කරන්නට ඕනෑ ; අපට මෙතන් හාස්කමක් ගැන කියන්න බැහැ. මහන්සි වෙලා වැඩ කරන හාස්කම පමණයි කියන්නට තිබෙන්නේ." ගරු සභාපතිතුමනි, ඔය කතාව අද ගුවන් විදුලි සංස්ථාව ගීතයෙන් කියන විට ඒ අය ඊට විරුද්ධයි. එදා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කිව්වෙත් ඔකමයි. එම කටයුත්ත අද බොහොම ලස්සනට ගුවන් විදුලි සංස්ථාව කරනවා. මම ඒ ගැන ප්‍රශංසා කරන්නට සතුටුයි. මා සිතනවා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා සිංහල සාහිත්‍ය රසය අගය කරන කෙනෙකැයි කියා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
**(Dr. N. M. Perera)**
ඔය සින්දු දුන් අපිත් කියනවා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
**(Mr. Premadasa)**
බොහොම හොඳයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
**(Dr. N. M. Perera)**
ඒ වෙන හේතුවක් උඩ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
**(Mr. Premadasa)**
යටියන්තොට ගරු මන්ත්‍රීතුමා—

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
**(Dr. N. M. Perera)**
"නැගී නැගී. . . . "

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
**(Mr. Premadasa)**
"නැගී නැගී . . ."—එකත් මම කියන්නම්. දවසක් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා "වැටි වැටි නැගිටිමු" යනුවෙන් සඳහන් වී ඇති ගීතය ගැන මතක් කළා. එම ගීතයට තමුන්නාන්සේ හරියට කන් දී නැහැ. මම දැන් ඒ ගීතය තමුන්නාන්සේට මතක් කර දෙන්නට කල්පනා කරනවා. ඒ අනුව මා තමුන්නාන්සේගෙන් අහනවා, ඒ ගීතය කුමන අන්දමේ එකක්ද යන ප්‍රශ්නය. එම ගීතය සුනිල් සාන්තගේයි. මෙන්න එම ගීතය ආරම්භ වන හැටි :

"දකුණ නැගෙනහිර බටහිර උතුරද
එක කොඩියේ හෙවණේ—— "

ගරු සභාපතිතුමනි, එහෙම කියන එක වැරදිද ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
**(Dr. N. M. Perera)**
ඒක පරණ එකක්නෙ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)
Do you know that Mr. Chib's greatest achievement in this country was to increase during his time the number of tourists who went from

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

Ceylon to India? The number of tourists that went from Ceylon to India increased remarkably during Mr. Chib's time.—[*Interruption*]. No, the correct figures. The tourists who went from Ceylon to India, not those who came from India to Ceylon, increased. His figures included Indians who came here, the T. R. P. holders and so on. I do not see on whose advice the original project was distorted. But, as far as those young people who chose hotelling as a career are concerned, I am sorry for them. I think it is unfair by them not to allow them a proper kind of training that should have been given to them in cooking, in waiting, in providing all the other services that the personnel of a hotel are expected to provide.

That there is a potential within the .3 per cent of world tourists that come to South East Asia, that there is a certain potential for increasing our own earnings within that figure, I do not doubt. How far we can develop in order to provide counter attractions to the tourists from the Adriatic, the Caribbean Islands and Latin America, I do not know. It may be possible to cut into that. Those centres earn something up to 94 per cent of world tourism, from tourists that go into those centres. America, Europe, Latin America command 94 per cent of world tourism. It may be possible on a very high development to cut into it, but the kind of services that seem to attract tourists, I do not think the Hon. Minister of State will want to permit. Perhaps he may say that Yugoslavia has done it, Czechoslovakia was doing it, there are certain countries like that where they have night clubs, strip-tease acts and all the rest of it; but I do not think the Hon. Minister of State would want to do those things here. And I am afraid that, with the standards that operate in our country, the public in this country would not like it or tolerate it or permit it.

So, we are left with an attempt to secure a tourist potential within a different kind of attractions and that is by developing our beaches, the various tourist attractions, the attraction that you can get by exploiting the sea, apart from the beach, deep sea fishing, sailing and so on. Our ruined cities, the archaeological attractions that we have, the diversity of vegetation and climate in which we are so rich within a range of 70 to 100 miles from the coast—we are blessed with these things—are our potential which we can use, but even with ordinary simple things we do not make a good start.

Then we have the old bathing wells at Trincomalee. What attempt has been made by the Tourist Board either to develop them or to encourage anybody else to do so? We have the fresh water spring by the side of the sea at Keerimalai in the North. What has been done to develop it as a tourist attraction? It has lost whatever religious significance it had, the most irreligious behaviour is indulged in at that spot by some people, not everybody. What could be done or what has been done in regard to exploitation of places like that? The Hon. Minister was very anxious to develop the view that was to be had from the Kandyan Climb. He wanted to clear the shanty-boutiques from that spot on the Kandyan run because it provided a beautiful view of the hill country, and he thought it would be an attraction for tourists. He wanted to use the powers conferred upon him by the Tourist Act in order to clear up that pace. No action is apparent as far as these things concerned. We are still making projects. We have made wonderful plans. We have spent a lot of money. The very people who are the custodians of the taxpayers money in this regard, all honour to them for their sincerity, as I said, for their devotion to this purpose and for their enthusiasm. But when you have so many different estimates of what you are going to get, what you are going to do on the basis of what you are going to get in 1972, what you think you can get in 1972 or 1976, how much you can earn on that basis—and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the inputs have multiplied from actual moneys spent to all the invisibles that are tied up; there is revenue loss on Customs duties, revenue loss by way of inland revenue on the concessions given; your five year tax holiday, your fifteen year tax holiday given in regard to hotels—it is time to sit down and think out carefully, what exactly is the correct projection.

අ. භා. 3

Now in that matter the Hon. Minister and the board have this difficulty. We began with appointing a Trade Commissioner as the Director of Tourism in this country, Mr. Annesley de Silva. He was a very clever man. He wrote well. He had some very good ideas on the subject and during his time he did very well. Then the age of civil servants came. They were very good civil servants. We had Mr. D.C.L. Amarasinghe, who produced some very good photographs which are still used for propaganda purposes and for decorative purposes. But during his time I had the melancholy duty of complaining that the expenditure involved in this entire photographic project was not in any way economical, that it was unduly large. He had a number of good ideas—I have no doubt about it—but we had to get down an architect for the particular purpose of constructing a ceiling in a resthouse. Then he went away. They come and they go. Mr. Amarasinghe went away and Mr. Derrick Aluvihare took over. Mr. Amarasinghe went to the Treasury and from there to agriculture and now, I believe, he is handling milk after getting out of the public service. Mr. Derrick Aluvihare has gone from tourism to higher education. There were certain other stopping places in between but at the moment he is handling higher education.

I am prepared to grant the versatility of our civil servants. I would be the last to contest the versatility of our civil servants. we are a very clever people. we have a lot of ingenuity. Even where it comes to the matter of trying to get round regulations and defeating the purposes of regulations, we are extremely ingenious. So, far be it for me to contest the fundamental assumption of the versatility of the civil servants. But today, of course, the civil servant is no longer there. The civil servant is part of the Administrative Service and we are called upon to grant even a greater degree of versatility to the Administrative Service, and that is why we shunt persons from handling tourism to something else, from handling information and broadcasting to something else, from labour to some other department, from immigration to health and so on. We are a versatile people. The entire Adminisrative Service has a wider range of versatility credited to it. It is credited with a wider range of versatility. Far be it for me to contest these fundamental assumptions. I am not contesting them for a moment.

But tourism languishes because we have people coming there, handling it for a short time on this basis, people having very good ideas, who then go away and leave the legacy to somebody else who has another set of new ideas on the subject and he does something for a short time and then goes away. When Mr. Derrick Aluwihare went away there was a deputy who had been there for some time, Mr. Senaratne. He had been acting for some time and apparently the powers that be did not like him and he has been shifted out to Lands. He is doing land development instead of tourism.

Now, he was a person who had earned the encomiums of people like Kovach whose reports were published by the Hon. Minister of State. He was a man who knew the subject. He had the opportunity of studying it for a long time. I dare say, he may have had his defects. Who does not have defects? But he has been sent over to Lands. So, tourism has suffered from the fact that you have a person handling it for a short time, and then somebody else comes and handles it, and so on, and today you have a Board handling it. The Board has so many different advisers.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

You have Mr. Chibb's advice. You have the Board's projections made on the basis that their own immediate officers make some kind of projection. You have the World Bank Report, you have the Feasibility Study, and all their projections give one a different picture of what the future is going to be.

I say it is time, whatever differences one may have, to get to the problems, to have these jobs done by real experts, by having experts who are real experts. By all means have the Tourist Board. It is not enough to have sincerity in regard to this matter, but you must have the necessary expertise who can study the problem and make some comments on the evaluation on which we are proceeding. What are the figures on which we really proceed ? What is our projection of the actual potential ? What are the movements of air traffic for the next five or ten years ? On that basis, what can Ceylon expect or attract ? What is required in order to attract them ? How many rooms ? For what kind of tourist ? Do we try to mould tourist tastes ? To what extent do we try to mould tourist tastes ? To what extent are we guided by the tastes that exist ? Those are the questions that you have to answer. Those are the questions that any person who is selling anything will have to answer. A person who is selling something, by his advertisement, by his propaganda, by what he puts in the market, is moulding tastes. On the other hand there is a certain demand created on the basis of which he has to mould himself and what he sells to meet the taste that exists.

There is a process of interaction in regard to tourism. What is the weightage you give to each ? These are questions that have to be thought out and my fear is that despite all the enthusiasm that goes into tourism on the part of the Minister, on the part of his Board and on the part of his Ministry, no proper scientific thinking is being done on the basis of evaluating these reports, making a proper study and using experts on the job. However enthusiastic the amateur may be, this is not a field in which amateur ideas can be of much use. Each one has a good idea and he thinks that that is the be all and end all of tourism. Some persons think it is necessary to develop proper transport facilities. Undoutedly transport is necessary. Another person thinks of hotels, resthouses etc. Somebody else had an idea of developing Sigiriya on the *son-et-lumiere* basis—*son-et-lumiere* projection of Sigiriya for the purpose of attracting tourists—and the board examined it and quite correctly came to the conclusion that it would be uneconomical.

No doubt, there are so many good ideas that people have from time to time, but there is not one good idea that goes to meet development all along the line. That is why I have to ask the Hon. Minister to have this matter considered properly at the proper level by the necessary experts in order to see that we can disentangle the truth out of these various projections that have been made. And, instead of propagandizing for tourism on the basis of fantastic earnings that are expected, it is better to make a much more conservative estimate of what is possible and what can be done and get down to the job of doing it in a proper and worthwhile way.

These are matters which I would like the Hon. Minister to consider. As I said, I do not want to be misunderstood as criticizing individuals or making adverse criticisms about people. I was only thinking of the plans and projections. I was thinking of what had happened so far, the money that has been put into it and the melancholy prospects we face, on the present performance, in regard to the future.

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*
(Mr. Leslie Goonewardene—Panadura)

Mr. Chairman, first of all I should like to agree with the hon. Member for Colombo South who pointed out

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

to the other Member for Colombo South, the Hon. Minister of State, that the building programme in regard to tourism is going forward very slowly, if it is indeed going forward at all, because my information is that the only buildings that have come up are those at Hikkaduwa ; and so far buildings anywhere else have not actually come up. There is a temporary slowness in the Hilton Hotel project which I do not think has completely fallen through, but the Negombo Hotel venture with U. T. A., I understand, has been dropped.

Unlike the hon. Member for Colombo South I am not despondent over the question of buildings not coming up because in one way it is rather good ; I think it gives the Hon Minister time to think things out a bit. Whenever I intervened in this House on this question it has always been my purpose to get information on this matter. You will agree that the idea of developing tourism has been initiated with one aim, that is with the aim of getting foreign exchange. The question, therefore, arises as to what extent actually we shall be able to improve our foreign exchange position by these ventures.

In the first place, there is the question of buildings. A large sum of money is needed for buildings. As far as I have been able to gather, it is only a little over 50 per cent of the foreign exchange component that is coming from abroad. I hope the Hon. Minister will correct me if I am wrong, but my information is that, generally speaking, the foreign exchange component is about 45 per cent. of the total cost on the average in regard to all these hotel ventures that have been contemplated. On construction ventures, the total cost is made up of 55 per cent. local expenditure and 45 per cent. foreign exchange component. Out of the 45 per cent. foreign exchange component about 25 to 30 per cent. is coming as investments from abroad; so, we have still to find about 20 per cent. of the total expenditure from local funds and that is a little less than half of the foreign exchange component. I am not against that. Although this expenditure may have to be met over a period of time, nevertheless we have to spend a considerable amount of our foreign exchange earnings ultimately for these ventures and, therefore, we hope to make considerable gains in the future.

On this matter I have questioned the Hon. Minister of State on an earlier occasion and also pointed out to him the need to have a proper break-up of the expenditure of the tourists in Ceylon. I pointed out that, in fact, the tourists in Ceylon, in so far as their living expenses are concerned— I am not talking of their purchases—are likely to spend money largely on things that are going to be imported into this country. For example, the money a tourist spends with regard to his travelling, the cost of petrol, wear and tear of the vehicle, is money that we have to send abroad in order to get down these articles here. It is only on the labour component—services—that we will be gaining. As far as food is concerned, about 90 per cent. of the food consumed in these hotels will be obtained from abroad unless some arrangement is made with these hotels. We cannot help it. The most expensive item in regard to food is liquor which is also obtained from abroad. We have to get it. We want to know these things in detail. Some of them have to be worked out. When a tourist comes to this country, lives in one of these hotels for two or three days and goes off, out of his living and travelling expenses, leaving his purchases aside, how much foreign exchange do we get ? It is necessary for us to know that if we are going to get back quickly enough, early enough, the foreign exchange that we are spending at the start on the very construction of these buildings to accommodate these people. I know there is no break-up of this nature that is available. Even, I think, in the Indian tourist organisation there is no break-up ; they give a certain percentage—so much food bought in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

the country, so much produced in the country and so much roughly outside. But I am not satisfied. I think it is necessary for us to go very completely into this matter. For example you can go to the Galle Face Hotel and find out in detail how much is spent on local items. Everbody would like to have a break-up of this nature, if we are going to have any accurate estimate of how much foreign exchange we are going to make from tourism.

අ. භා. 3.15

The other point, as pointed out by the hon. Member for Colombo South (Mr. Bernard Soysa), is that we are all amateurs in this matter. Tourism is a highly competitives business and we are, in the last resort, not really competent to make an analysis and come to conclusions unless experts have been studying the question and placing the relevant material before us. Now, in that connection, I would suggest to the hon. Minister that we get the services of permanent experts for this business. Up to now we have got experts to come and make some kind of a report and go. I say that is not enough. There is the Tourist Board of amateurs: why not put some expert or even two experts permanently at the service of that Board, so that their expert advice will be constantly available to it. I have no doubt that the members of that body are honest and very enthusiastic people, but I do not think they have the capacity to understand the problems we are faced with. For that purpose I suggest that a permanent expert or experts be attached to the Board, and I would strongly urge that these experts be obtained from Europe and not from the United States of America, which as far as I am aware caters for a different kind of tourist, and we are likely to get more tourists from Europe than the U.S.A.

These are the two suggestions I wish to make: that you must have a proper break-up of expenditure and know exactly, as far as possible, where we stand and how much foreign exchange we are going to get by the influx of tourists in this country; and secondly, that since this is an expert's business and a very competitive business, we do need the services, the permanent services, of tourist advisers.

I have a very high regard for the capacity of the Hon. Minister of State, but I do not know whether in the matter of tourism that capacity is being made use of. He has so much work to do and I do not think he has time to devote to this very important subject. Most of his time in the past has been expended in organising by-elections, etc. and his services, I know, are very valuable for that purpose. I have seen his statistics in regard to voting figures, voters, etc. I am sure he did signal service to the United National Party in those by-elections. He is very busy and he cannot devote much time to this question. Therefore I would appeal to the Minister to try and devote a little time to investigate some of the matters that we have pointed out.

**ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

ගරු සභාපතිතුමනි, රාජ්‍ය ඇමතිතුමාගේ වැය ශීර්ෂ යටතේ පැවැත්වෙන මෙම විවාදයේදී එතුමා විසින් මුලින් ඉදිරිපත් අර ඇති රෙගුලාසි මාලාවක් ගැන—විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමය සම්බන්ධයෙන් මැයි මාසයේදී ඉදිරිපත් කරන ලද රෙගුලාසි මාලාව ගැන—මගේ කල්පනාවේ හැටියට සෑහෙන දුරට විමර්ශනයක් කිරීමට දැන් සුදුසු වේලාව පැමිණ තිබෙනවා.

මෙම රෙගුලාසි මාලාව යටතේ මේ රටට ගෙන්වනු ලබන ආනයන ද්‍රව්‍යයන් කොටස් තුනකට වෙන් කළ බව එතුමාට මතක ඇති. උප ලේඛන තුනකට බෙදා ඒ ඒ උප ලේඛන යටතේ ද්‍රව්‍ය වෙන් කර තිබුණා. පළමුවෙනි කොටසට මේ රටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය, බෙහෙත් ද්‍රව්‍ය, කෘෂි කාර්මික ද්‍රව්‍ය යන වර්ගීත්, දෙවැනි කොටසට මේ රටේ කර්මාන්ත දියුණුව සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍යත් වෙන් කර පෙන්වා තිබුණ අතර, "ඕ.ජී.ඇල්." ක්‍රමයට මේ රටට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන්වන ආනයන භාණ්ඩ මොනවාද කියා තුන් වෙනි කොටසට ඇතුළත් වී තිබුණා. ඒ රෙගුලාසි මාලාව ඉදිරිපත් කර මාස තුනකට පසුව අපටත් රටටත් පත්‍ර මාර්ගයෙන් දකින්න ලැබුණා, මේ රටට අනවශ්‍ය ද්‍රව්‍ය බොහොමයක් මෙම "විවිහිස" ක්‍රමය යටතේ ගෙන්වා තිබෙනවා කියා. ඒ අතරම මේ රටට මූලික වශයෙන් අවශ්‍ය වන ද්‍රව්‍ය—විශේෂයෙන්ම සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය—ගෙන්වීම ඉතාම සීමා සහිත වී තිබෙන බවත් අපට දැනගන්නට ලැබී තිබෙනවා. විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමය පිළිබඳව හොඳ හෝ නරක මේ අවස්ථාවේදී විවේචනය කිරීමට මා අදහස් කරන්නේ නැහැ. එහෙත් දැනට තිබෙන නීති රීති යටතේ කෙරෙන කටයුතු පිළිබඳව නැවත සමීක්ෂණයක් කරන එක නම් ඉතාමත්ම අවශ්‍ය බව මා සඳහන් කරන්න කැමතියි.

මේ සම්බන්ධයෙන් මම තවත් කාරණාවක් පෙන්වා දෙන්නම්. එනම් තුන්වෙනි උප ලේඛනයට ඇතුළත් කර තිබෙන ද්‍රව්‍ය ගැනයි. ඒ උප ලේඛනයට ඇතුළත් වී තිබෙන ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම පළමුවෙනි උප ලේඛනයට ඇතුළත් කිරීම සුදුසුය කියා මා විශ්වාස කරනවා. එනම් එක්තරා ප්‍රමාණයක්—quota—සඳහා විදේශ විනිමය වෙන් කර ඒ විදේශ විනිමය සාමාන්‍ය වටිනාකමට—official rate එකට නොහොත් නීත්‍යානුකූල මිලට— ගෙන්වීම ඉතාමත් අවශ්‍ය වී තිබෙනවා. මේ රටේ සෑම ද්‍රව්‍යයකම මිල දැන් ඉහළ නැඟ තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. එසේ මිල නැඟ ඇති ද්‍රව්‍ය අතර ඉතාමත් අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යත්, ඒ වාගේම සංවර්ධනයට අවශ්‍ය ද්‍රව්‍යයත් ඇති අතර, ඒවා ගෙන්වා ගැනීමටත්, අද වෙළෙඳ පොළෙන් ලබා ගැනීමටත් අපහසු වී තිබෙනවා. ඒ හේතුකොටගෙන විශාල මුදලක් වියදම් වන නිසා අද ඒ කර්මාන්ත පවත්වාගෙන යාම අඩපණ වී තිබෙන බවත් මා සඳහන් කළ යුතුව තිබෙනවා.

විශෙෂයෙන්ම රෙදිපිළි ගැන බලමු. පසුගිය අය වැය ලේඛනයෙන් රජය රෙදිපිළිවලට අත ගැසූ නිසා මෙය ලොකු විහිළුවක් වී තිබෙනවා. එය විහිළුවක් වී ඒ පිළිබඳව විවේචනය වුණා පමණක් නොව, එයින් ඇති වුණ දූෂණ රාශිය මකා ගන්නට බැරුව මේ රටට සියයට සියයක් රෙදි පිළි ගෙන්වන සුළු සලට පවා එක්තරා නීති රීති පංක්තියක් පනවන්නට රජයට සිදු වුණා. එසේ සිදු වුණේ ඕ. ජී. එල්. ක්‍රමයට රෙදි පිළි ගෙන්වන්නට යාම නිසයි. එම නිසා ඕ. ජී. එල්. ක්‍රමයෙන් රෙදි පිළි අයින් කර රෙදි පිළි ආනයන කිරීමේ එක්තරා ඒකාධිකාරයක් සළු සලට දී තිබෙනවා නම් මේ තත්ත්වය නැති කර ගත හැකි බව මා සඳහන් කරන්න කැමතියි. එසේ දෙන අතර official rate නොහොත් නීත්‍යානුකූල මිල යටතේ මේ රටට රෙදි ආනයන කිරීමට පියවරක් ගන්නවා නම් ඉතාම හොඳය කියා මා රාජ්‍ය ඇමතිතුමාට කියන්න කැමතියි. එයින් විශාල දූෂණ රාශියක් මගහැරී යනවා. එපමණක් නොවෙයි. පාරිභෝගිකයාට දරන්නට බැරි තරමට ඉහළ ගොස් තිබෙන මිළත් පහළ බසිනවා.

එවැනි තවත් ද්‍රව්‍යයක් තමයි කපු. තවත් එවැනි ද්‍රව්‍ය කීපයක්ම තිබෙනවා. රබර් වගාවට වුවමනා කරන ගෙන්දගම් ගැන බලන්න. මෙවැනි අවශ්‍යම ද්‍රව්‍ය, නිෂ්පාදනයට වුවමනා කරන ද්‍රව්‍ය ඕ. ජී. එල්. ක්‍රමය යටතේ ගෙන්වීමට තීරණය කළේ කුමන හේතු උඩද කියා මා ප්‍රශ්න කරනවා. ඕ. ජී. එල්. ක්‍රමය යටතේ බඩු ගෙන්වන්නට අර විදේශ විනිමය හිමිකම් සහතික ගන්නට ඕනෑ. ඉතින් ඒ ක්‍රමයට ගෙන්වන විට මිළ ඉහළ යෑම ගැන ප්‍රශ්නයක් නැහැ. ගරු ඇමතිතුමාම ඒක පිළිගන්නවා. වි.වි.හි.ස. මාර්ගයෙන් ගෙන්වන විට සියයට 45 කින් පමණ මිළ ඉහළ යන බව එතුමා පිළිගන්නවා. වි. වි. හි. ස. සඳහා වැඩිපුර ගෙවන්නට සිදුවන ප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් මිළත් ඉහළ යනවා. පාරිභෝගිකයාමයි ඒ වැඩිපුර මුදල ගෙවන්නට සිදු වන්නෙ. එම නිසා රබර්වලට වුවමනා කරන ගෙන්දගම්, කෘමිනාශක බෙහෙත්, විෂබීජ නාශක බෙහෙත් යනාදියත්. ඒ වාගේම ගොවිතැන් කටයුතුවලට වුවමනා කරන අනෙකුත් අවශ්‍ය ද්‍රව්‍යත් "කැටිගරි ඒ" නමැති කොටසට ඇතුළු කිරීම වඩා සුදුසුය කියා මා කල්පනා කරනවා.

ඊළඟට මේ රටට ගෙන්වන ට්‍රැක්ටර්වල හා ලොරිවල මිළ ගණන් ගැනත් වචනයක් කිව යුතුව තිබෙනවා. මීට මාසයකට පමණ ප්‍රථමයෙන් බ්‍රවුන් සමාගම ගෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]
වන ටොන් 5 ලොරියක මිළ රු. 42,000 කට නියම කර තිබුණා. නමුත් ඊට සතියකට පසු ටොන් 5 එම ලොරියේම මිළ රු. 42,900 ක් කළා. ගිය සතියේ එම ලොරියේම මිළ රු. 46,000 දක්වා ඉහළ දමා තිබෙනවා. මේ ආකාරයට මිළ දිනෙන් දින ඉහළ යන්නේ ඕ. ජී. එල්. ක්‍රමය යටතේ මේවා ගෙන්වන නිසයි. ලොරිවල පමණක් නොවෙයි, ඕ. ජී. එල්. ක්‍රමය යටතේ ගෙන්වන සෑම ද්‍රව්‍යයකම මිළ ඉහළ නැගගෙන යනවා. එම නිසා මේ ද්‍රව්‍ය පිළිබඳව මිළ පාලනයක් ඇති කළ යුතුයි. නැත්නම් මේ ද්‍රව්‍ය මා කලිනුත් සඳහන් කළාක් මෙන් "කැටගරි ඒ" කොටසට දමා ගෙන්විය යුතුයි. මේවත් අවශ්‍යම ද්‍රව්‍ය හැටියට සැල කිය යුතුයි. එහෙම නොකළොත් මේ අවශ්‍යම ද්‍රව්‍යවල මිළ, රටේ සංවර්ධනයට අවශ්‍යම ද්‍රව්‍යවල මිළ, මහජනතාවට දරන්නට බැරි වන තරමට ඉහළ නගින බව මා මතක් කරනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමා එතුමාගේ අමාත්‍යාංශය යටතේ "කොන්සොලිඩේටඩ් එක්ස්පෝට්" නමැති අළුත් අපනයන ව්‍යාපාරයක් පටන් ගෙන තිබෙනවා. තවම ඒක වර්ධනය වෙලා ආවෙ නැහැ. එහෙත් මේ සංවිධානය මේ රටේ තේ, පොල්, රබර් අපනයනය කිරීමට වරින් වර මහන්සි ගෙන තිබෙන බව ඒ අය යම් යම් රටවල් සමග ඇති කර ගත් සුළු කොන්ත්‍රාත් කිහිපයකින් පෙනී යනවා. රුසියාව සමග කොන්ත්‍රාත්තුවක් ඇති කරගෙන තිබුණා. දැන් එක්සත් අරාබි ජන රජය සමග තවත් කොන්ත්‍රාත්තුවක් ඇති කර ගන්න බලාපොරොත්තු වෙනවා. එහෙත් "කොන්සොලිඩේටඩ් එක්ස්පෝට්" ව්‍යාපාරයෙන් ගරු රාජ්‍ය ඇමතිතුමා බලාපොරොත්තු වුණේ මේ අපනයන ද්‍රව්‍යයන් පිටරට යැවීමට නොවෙයි. හවුල් ව්‍යාපාර හැටියට හෝ අපනයන කට යුතුවලට රජය එක අතකින් මැදිහත් විය යුතු බව මා පිළිගන්නවා. ඇත්තවශයෙන්ම මේ "කොන්සොලිඩේටඩ් එක්ස්පෝට්" ව්‍යාපාරය සාර්ථක කරගෙන එයින් නියම ප්‍රයෝජනයක් ලබා ගන්ට නම් මේ රටේ සුළු අපනයනයන් විශාල වශයෙන් අපනයනය කිරීමට යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. රුපියලේ අගය අඩු කිරීමෙන් පසුව සුළු අපනයනයන් රාශියක් විශාල වශයෙන් මේ රටෙන් පිටරට යවන්නට පුළුවන් වේ යයි රජය අදහස් කළා. එහෙත් මුදල් ඇමතිතුමාම ප්‍රකාශ කර තිබෙනවා, සුළු අපනයන ද්‍රව්‍යවලින් වැඩි ආදායමක් අපට ලැබී නැති බව. "විදේශ ආධාර" නමැති එතුමාගේ ප්‍රකාශනයකම ඒ බව සඳහන් කර තිබෙනවා.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
**(The Hon. U. B. Wanninayake—Minister of Finance)**
ටිකක් කල් දෙන්ට ඕනෑනෙ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
**(Mr. Jayakody)**
එතුමා දැන් අපෙන් කල් ඉල්ලනවා. එහෙත් ඒක කවදාවත් සිදු වෙන්නෙ නැහැ. මේ රටේ අපනයනවලින් සුළු අපනයන තිබෙන්නෙ සියයට 8 යි. රුපියලේ අගය අඩු කිරීමෙන් පසු කරදමුංගුවල මිළ නැග්ගද, පැඟිරිවල මිළ නැගග්ද කියා මා අහන්ට කැමතියි. ඔය විධියේ සුළු අපනයනවල මිළ නැග්ග නම් වැඩිපුර ආදායමක් ලැබෙන්න ඕනෑ. 1968 මාර්තු සිට මේ දක්වා සංඛ්‍යා ලේඛන ලබා ගත්තොත් සුළු අපනයන කිසිවක මිළ නැග නැති බව පෙනී යනවා. පොල් වැනි ප්‍රධාන අපනයනවල මිළ නම් තරමක් වැඩි වී තිබෙන බව පිළිගන්නවා. එම නිසා "කොන්සොලිඩේටඩ් එක්ස්පෝට්" ව්‍යාපාරය විශේෂයෙන් සුළු අපනයන ද්‍රව්‍ය පිටරට යැවීම සම්බන්ධයෙන් ටිකක් මහන්සි ගත්තොත් අපේ ඇතැම් සුළු අපනයන ද්‍රව්‍යයන්ට සෑහෙන මිළක් ලබා ගන්නට පුළුවන් වේ යයි මා විශ්වාස කරනවා.

අ. භා. 3.30

තායිවානය කියන රට තමුන්නාන්සේ දන්නවා. තායිවානය දැනට අවුරුදු 2 කට විතර කලින් හතු වර්ගයක්—"මෂ්රූම්"—පිටරට යවන්ට පටන් ගත්තා. අවුරුදු 2 ක් ගත වුණාට පසුව ඒ හතු වර්ගය පිටරට යැවීමේ ප්‍රමාණය සියයට 600 කින් වැඩි වුණා. එය ඉතා සුළු අපනයන ද්‍රව්‍යයක්. සුළු අපනයන පිටරට පැටවීමෙන් විශේෂයෙන්ම දියුණු වෙගන යන රටවලට සෑහෙන විදේශ විනිමය ප්‍රමාණයක් ලැබී තිබෙනවා. ඇතැම් රටවල් සුළු අපනයන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිටරට යැවීම සියයට 400 කින් 500 කින් දියුණු කරගෙන තිබෙනවා. එම නිසා මේ "කොන්සොලිඩේටඩ් එක්ස්පෝට්" ව්‍යාපාරයත් අපේ සුළු අපනයන ද්‍රව්‍යයන් විශාල වශයෙන් පිටරට පැටවීමට කටයුතු කරනවා ඇතැයි මා විශ්වාස කරනවා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා), කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් (ඉලංගරත්න මයා.) මුදල් ඇමතිවරුන් වශයෙන් සිටි වකවානුවලදී අපේ ඇතැම් සුළු අපනයනවලට සෑහෙන තැනක් තිබුණා. එක වෙලාවක පුවක්වල තීරු ගාස්තුව අඩු කළා. ඒ නිසා පුවක්වලට සෑහෙන මිළක් ලැබුණා. අපේ සුළු අපනයන විශාල වශයෙන් පිටරට යැවීමට මාර්ගයක් සකස් කළොත් අපට විශාල විදේශ විනිමයක් ලබා ගත හැකි බව මතක් කරන්ට කැමතියි.

ඊළඟට සමුපකාර තොග වෙළඳ සංස්ථාව ගැනත් කරුණක් දෙකක් කියන්ට කැමතියි. සමුපකාර තොග වෙළඳ ආයතනය අද නම් තිබෙන්නෙ ක්‍රමානුකූලව මැරීගෙන යන තත්ත්වයකයි. දැන් ඒකෙ බෙල්ල මිරිකල අවසානයි. එහි මළගමත් දැන් ඉතාම කිට්ටුයි. එය සම්පූර්ණයෙන්ම අහෝසි කර දැමීම සඳහා ගරු රාජ්‍ය ඇමතිතුමා කටයුතු කරගෙන යාම ගැන මම මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. අද සමුපකාර තොග වෙළඳ අයතනය ටිකක්වත් පණ රැකගෙන සිටින්නේ ඒ ආයතනය මගින් මෙරටට ගෙන්වන කරවල ප්‍රමාණය නිසයි. එහෙත් සී. ඩබ්ලිව්. ඊ. එක මගින් අවශ්‍ය විධියට නැත්නම් වුවමනා විධියට එහෙමත් නැත්නම් පාරිභෝගිකයාට ඕනෑ කරන විධියට කරවල බෙදා හැරෙන්නේ නැහැ.

එයට එක හේතුවක් කියන්නම්. මා පෞද්ගලික අංශයට පක්ෂව කථා කරනවා නොවෙයි. එහෙත් අද කරවල බෙදීම කෙරෙන්නේ කොහොමද? සී. ඩබ්ලිව්. ඊ. එක ගෙන්වන කරවලවලින් සියයට 70 ක් පමණම දෙන්නේ සමුපකාර ව්‍යාපාරයටයි. ඉතිරි සියයට 30 කෙලින්ම පෞද්ගලික ව්‍යාපාරිකයින්ට යනවා. එහෙත් අද සිදු වී තිබෙන්නේ කුමක්ද? සමුපකාර ව්‍යාපාරය මගින් බෙදා හැරීමට දෙනු ලබන සියයට 70 න් සියයට 20 කට වඩා සමුපකාර ගබඩා හා කඩ සමිති මාර්ගයෙන් බෙදා හැරෙන්නේ නැහැ. අනික් කොටස එක්කෝ සංගමයෙන් පෞද්ගලික ව්‍යාපාරිකයන්ට යනවා; නැත්නම් කඩයෙන් පෞද්ගලික ව්‍යාපාරිකයන්ට යනවා. සමුපකාර ව්‍යාපාරය මගින් බෙදා හැරීමට ලැබෙන සියයට 70 න් සියයට විස්සක්වත් පාරිභෝගිකයින් අතර බෙදා හැරෙන්නේ නැහැ. සියයට 50 ක් පමණ කෙලින්ම පෞද්ගලික ව්‍යාපාරිකයන්ට යනවා. සමුපකාර තොග වෙළඳ ආයතනය වගේ මේ සමුපකාර ව්‍යාපාරයත් මරන්නට තමුන්නාන්සේලාගේ හිතේ තිබෙනවා නම් මෙහෙම කරගෙන ගියාට කමක් නැහැ. එහෙත් එයට පාරිභෝගිකයින් අල්ලා ගන්න එපා. අද කරවල මිල ගැන කෑ ගසන්නට පාරිභෝගිකයින්ට සිදු වී තිබෙනවා. කන්නට පුළුවන් හාල්මැස්සන් රාත්තලක් රුපියල් 3ක් නැත්නම් 3.50 ක් පමණ වෙනවා. තෝර කරවල ආදී කන්නට පුළුවන් අනිකුත් හැම කරවල වර්ගයක්ම රාත්තල රුපියල් 3ට වැඩියි. කන්නට නොහැකි කරවල නම් රුපියල් 2 කට හෝ 2.50 කට පමණ ගන්නට පුළුවන්. එහෙත් බෙදාහැරීමේ අංශවලට නොයෙකුත් මාර්ගයන් යොදන්නට ගියොත් පාරිභෝගිකයා තැළෙන නිසා එවැන්නක් කරන්න එපා. ඒ නිසා පාරිභෝගිකයා හෝ පෞද්ගලික වෙළෙන්දා හෝ සමුපකාර සමිති හෝ ආරක්ෂා කරන්නට තමුන්නාන්සේලාට සිදු වී තිබෙනවා. සමුපකාරයත් පාරිභෝගිකයාත් ආරක්ෂා කරන්න නම් කරවල වෙළඳාම පෞද්ගලික අංශයට දෙන්නට එපා. පෞද්ගලික වෙළෙන්දාත් පාරිභෝගිකයාත් ආරක්ෂා කරන්නට ඕනෑ නම් සමුපකාරයට දෙන්නට එපා. මා හිතන විධියට කරවල වෙළඳාම පවරන්නට පුළුවන් වෙළඳ සංගම් මේ රටේ තිබෙනවා. වෙළඳ මන්ත්‍රණ සභාව මගින් අපේ කොට්ඨාශවල ඇති කළ සෑහෙන තරම් දුරට හොඳින් වැඩ කරගෙන යන ආයතන තිබෙනවා. හොඳින් කරගෙන යන පෞද්ගලික ඒවාත් තිබෙනවා. එහෙත් කරවල බෙදාහැරීම ගම්බද මට්ටමේ සිටින පුද්ගලයන්ට දෙන්නට නම් කරුණාකර ඔය කියන ක්‍රම දෙකින් එකක් පමණක් භාවිතයට ගන්න. දූෂණයට මුල් වී තිබෙන්නේ ඒ දෙකම කරන්නට යෑමයි. අද එක කඩේ නම් ඕනෑ තරම් කරවල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

තිබෙනවා. ඒ නිසා මේ ගැන ගරු ඇමති තුමා ටිකක් සැලකිලිමත් වේය කියා මා විශ්වාස කරනවා.

අනික් කරුණ සළුසල ගැනයි. සළුසලේ රෙදි මිල ආදිය ගැන කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. එය සළු සල අධ්‍යක්ෂවරුන්ගේ පරිපාලනය යටතේ තිබෙන එකක්. ඒ අයට ඕනෑ විධියට එය පාලනය කරන්නට ඔවුන්ට පුළුවන් කම තිබෙනවා. හැම විටම රජයට කියන්නේ රුපියල කැපීමේ හේතුවයි. දෙවැනිව කියන්නේ විදේශ විනිමය සහතික පත්‍ර කැපීමේ හේතුවයි. ඒ නිසා ඒ හේතු දෙක පෙන්වා කරන සෑම වැරදි වැඩක්ම වසන් කරන්නට යනවා. මිල නම් වැඩිවන බව අපි විරුද්ධ පාර්ශ්වයේ සිටගෙනත් කීවා. මේ ක්‍රම දෙක යෙදූ විට අභ්‍යන්තර මිල වැඩි වෙන වාය කියා ගරු අගමැතිතුමාත් පිළිගෙන තිබෙනවා. ඒ නිසා අභ්‍යන්තර මිල නොනැගීමට යම් වැඩ පිළිවෙළක් ඇති කිරීමට ගරු ඇමතිතුමාට සිදු වෙනවා. මා කලින් කී විධියට ඕ. ජී. එල්. ක්‍රමයට රෙදි ගෙන්වීමට ඉඩ දුන්නොත් එය කරන්නට පුළුවන් වන්නේ නැහැ. රෙදි මේ රටට අවශ්‍යයි. මහජනයා රෙදි අඳින්නත් ඕනෑ; රෙදි මේ රටට ගෙන් වන්නත් ඕනෑ. එමෙන්ම දේශීය රෙදි නිෂ්පාදනයට පහරක් වදින නිසා ඒවායේ මිල පාලනය කරන්නත් සිදු වෙනවා. ඒ නිසා කරුණාකර මෙයත් අර "ඒ" කැටගරි එක යටතේ ගෙන්වන්නය කියා මා ගරු ඇමතිතුමාට මතක් කරනවා. එසේ නොකළොත් අනාගතයේදී භයානක තත්ත්වයක් ඇති වෙනවා. එනම් මේ රටේ දේශීය රෙදි නිෂ්පාදනවලට බලවත් පහරක් වදින්නට ඉඩ තිබෙනවා. සමහර රෙදි වෙළෙන්දෝ ඕ. ජී. එල්. ක්‍රමය යටතේ රෙදි වෙනුවට "මෝටර් ස්පෙයා ර්ස්" ගෙන්වන බව මා දන්නවා. කරන්නේ රෙදි වෙළඳාම ගෙන්වන්නේ මෝටර් ස්පෙයාර්ස්. රෙදි ඕ. ජී. එල්. ක්‍රම යට ගෙන්වීමේ අවශ්‍යතාවයක් නැහැ. ඒ නිසා කරුණාකර රෙදි ගෙන්වීම මේ ක්‍රම යෙන් අයින් කර අවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වීමේ අංශයට දමන්න. එසේ කළොත් මිල පාලනයක් කරන්නත් පුළුවන්; ලාභයට පාරිභෝගිකයින්ට රෙදි ලබාගන්නත් පුළුවන්; ඇත්ත වශයෙන් තමුන්නාන් සේලා ම රෙදිපිළි ගෙන්වනවා නම් තමන්ට ලැබෙන ඉන්වොයිස් වලින් එම රෙදිවල නියම මිළ කීයද කියන එක පැහැ දිලිකර ගන්නත් පුළුවන්. මේ විධියට නිද හස් කරගෙන යන විට, අද තිබෙන විදේ ශීය විනිමය ප්‍රමාණය අනුව, මේ රටින් කොපමණ මුදලක් පිටරටවලට ඇදී ගොස් තිබෙනවාද යන විගවත් හොයා ගන්නට බැරි වෙනවා. එම නිසා මේ ගැන ගරු ඇමති තුමා හොඳින් සලකා බලනු ඇතැයි මා විශ්වාස කරනවා.

අවසාන වශයෙන් මා සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් වචනයක් දෙකක් කියන් නට කැමැතියි. දකුණු කොළඹ ගරු මන්ත්‍රී තුමාත් (බර්නාඩ් සොයිසා මයා.) පානදුරේ ගරු මන්ත්‍රීතුමාත් (ලෙස්ලි ගුණවර්ධන මයා.), අප විසින් මේ රටට ගෙන්වා ගත යුත්තේ කුමන විධියේ සංචාරකයන්ද, අද එන්නේ කොයි ආකාරයේ පුද්ගලයන්ද යන්න ගැන විශාල සැකයක් පහළ කර මින් කථා කළා. ඒ අදහස් සියයට සිය යක්ම අනුමත කරන්නට මා කැමතියි. දේශ සංචාරකයන් වශයෙන් මේ රටට ගෙන්වා ගත යුත්තේ කුමන පුද්ගලයන් ද යන්න ගැන පැහැදිලි අවබෝධයක් අපට නැහැ. මේ රටේ දේශගුණය—උෂ්ණත්වය—ලැබීමේ බලාපොරොත්තුවෙන් ශීත රට වල සිට මෙහි එන සංචාරකයන්ට ඒ අවශ්‍ය තාව ඉටු කර දීමත් පුරා විද්‍යා අංශයෙන් මේ රටේ ඇති යම් යම් නටඹුන් ආදිය දැක බලා ගැනීමට සැලැස්වීමත් ඒවාගේම අපේ ඉතාමත්ම පැරණි සංස්කෘතික සංදර්ශණ යක් වශයෙන් පැවැත්වෙන මහනුවර පෙරහැර වැනි දේ නැරඹීමට අවස්ථාව ලබා දීමත් යන මේවායි, මෙතෙක් කල් අප මේ රටින් දේශ සංචාරකයන්ට දිය හැකි දේ හැටියට සැලකුවේ. දෙවැනි ලෝක මහා යුද්ධයෙන් පසු, 1948 දී පමණ, පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් වූත් නොවූත් සෑම රටක්ම පාහේ තමතමන්ගේ සංස් කෘතීන් විදහා පෑමේ මහා සංදර්ශණය සඳහා එඩින්බරෝ නගරයට පැමිණි අවස් ථාවේදී එහි ප්‍රදර්ශනය කෙරුණු නොයෙක් සංස්කෘතික අංග අතරින් ලංකාවේ උඩරට නැටුමට ප්‍රමුඛස්ථානය ලැබුණු බව අපට තවමත් මතකයි. එහෙත් ගරු ඇමතිතුමා මේ වාරයේ මහනුවර පෙරහැර නැරඹුවා නම් එය කොතරම් දුරට මළානික,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අප්‍රාණික තත්ත්වයකට පත්ව තිබෙනවාද යන වග දකින්නට ඇති. තව අවුරුදු 10 ක් මේ විධියට ගත වුණොත් අපේ මේ පැරණි සංස්කෘතික අංග ක්‍රම ක්‍රමයෙන් අලංකාර යෙන් තොර වී ඉතාම කණගාටුදායක තත්ත්වයකට පරිවර්තනය වන්නට පුළුවන් බවට මා තුළ විශාල සැකයක් පහළ වී තිබෙනවා.

මේ රටට එන සංචාරකයන්ට පෙන්විය හැකි වටිනා දේවල් සෑම දෙයක්ම දැන් ක්‍රමක්‍රමයෙන් නැති වේගෙන යන තත්ත්වයක් ඇති වී තිබෙනවා. අසුවල් අසුවල් දේ නැරඹීමට දේශ සංචාරකයන් මේ රටට එනවා ඇතැයි ඇමතිතුමා අදහස් කරනත් එය මේ තත්ත්වය යටතේ ඉෂ්ට වන්නේ නැහැ. ඒ නිසා මේ ගැන වෙනම කල්පනා කළ යුතුව තිබෙනවා. වෙනත් උෂ්ණ කලාපික රටවලට යන සංචාරකයන් ඒවායෙහි දවස් 5 ක් පමණක් නැවතී සිට අපසු යන්නේ නැහැ. ඒ රටවල ඔවුන් අඩු ගණනේ හය මාසයක්වත් පදිංචි වී සිටි නවා. එසේ නැවතී සිට ඔවුන් ඒ රටවල උෂ්ණත්වයේ ප්‍රයෝජන ලබා ගන්නවා. දැන් අපේ රටට තරුණ සංචාරකයන් වැඩි වශයෙන් එන්නේත් නැහැ. එන්නේ මහල්ලන් පමණයි. තායිලන්තය, ජපානය වගේ රටවලට තරුණයන් ගියාවේ. මහල්ලන් ටික අපි මෙහාට ගෙන්වා ගනිමු. ඒ අයට සල්ලි තියෙනවා. ජීවිතයේ අවසාන කාලය තුළදී කොහේ හෝ රටකට ගොස් පර්යේෂණ කරන්නට පුළුවන් උදවිය ඉන්නවා. කල්පනා ශක්තිය යොදා කට යුතු කරන්නට පුළුවන් උදවිය ඉන්නවා. ඒ අයට ඇවිත් 6 මාසයක්වත් මේ රටේ නැවතී අපේ ශිෂ්ටාචාරය සම්බන්ධව කට යුතු කරන්නට අවස්ථාවක් දුන්නොත්, අද වෙන වෙන මාර්ගවලින් ලැබේය කියා බලාපොරොත්තු වෙනවාට වඩා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් මේ රටට ලබා ගැනීමට පුළුවන් වෙනවා.

ගරු සභාපතිතුමනි, දැනට සාදාගෙන යන හෝටල්වලට ඇති වෙන්නට සෙනග පිරේය කියා මා විශ්වාස කරන්නෙ නැහැ. ලංකාවේ කාටවත් ඔය හෝටල්වල නව තින්නට බැහැ. ලංකාවේ කාටවත් ඔය හෝටල්වලින් කෑම කන්නට බැහැ. ඒ හෝටල්වල කෑම සඳහා යන වියදම ගැන බැලුවාම එය අපට පෙනෙනවා. හෝටල් සංඝාව ගැන කථා කරන ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්වා, ලංකාවේ කම්කරුවන්ටත් ඒ හෝටල්වලට ඇතුලුවන්නට පුළුවන් පිළිවෙලට ඒවා සකස් කරනවාය කියා. නමුත් හික්කඩුවේ කොරල් ගාඩ්න්ස් වල ගිහින් දවසක් ඉන්නට රුපියල් 50 ක් වියදම් කරන්නට පුළුවන් කම්කරුවකු ලංකාවේ තබා මිහි තලයේ කොහේවත් නැහැ. කෙසේ වෙතත් අලංකාර විධියට ඒ ස්ථාන තියෙන්නට ඕනෑ. ඒ සමගම සැල කිය යුතු කාරණයක් තියෙනවා. විදේශ සංචාරකයන් වශයෙන් පැමිණෙන අය සී. අයි. ඒ. සංවිධානය වැනි සංවිධානවලට අයිති භයානක පුද්ගලයන්ද කියා සොයා බලන්නටත් ඕනෑ. අපට විදේශිකයන් ගෙන්වා ගන්නටත් ඕනෑ. ඒ අයගෙන් අපට මුදල් අය කර ගන්නට පුළුවන් වන්නටත් ඕනෑ. ඒ සමගම විශේෂ දැන උගත්කම් ඇති අය අපට ගෙන්වා ගන්නට පුළුවන් වුණොත් ඒ අයගේ බුද්ධියෙන් දෙන්නට පුළුවන් සේවයත් අපට ලබා ගන්නට පුළුවන්.

විදෙශිකයා කියන්නේ සුදු මිනිහා පමණක් නොවෙයි. විදේශිකයා කිව්වම කළු මිනිහත් එකයි; ගුරුපාට මිනිහත් එකයි; සුදු හමක් තියෙන පුද්ගලයත් එකයි. ඒ නිසා දේශ සංචාරකයන් හැටියට විවිධ මිනිසුන් මේ රටට ආවට කමක් නැහැ. ඒ අය ගෙන්වා ගැනීමට යම් වැඩ පිළිවෙළක් යෙදුවොත් හොඳ බව මා විශ්වාස කරනවා. විදේශ විනිමය සම්බන්ධව විශාල දූෂණ ව්‍යාපාරයක් අද මේ රටේ ඇති වී තිබෙනවා නම් දේශ සංචාරක ව්‍යාපාරය එයට එක හේතුවක් වී තිබෙන බව මා කණගාටුවෙන් වුණත් කියන්නට ඕනෑ.

අ. භා. 3.45

දේශ සංචාරක ව්‍යාපාරයේ නාමයෙන් ගෙන්වා තිබෙන කාර් "ටුවරිස්ට් කාර්" යන නම ඇතිව රටේ තොටේ එහා මෙහා යනව අපට දකින්නට ලැබෙනවා. නමුත් ඔය ටුවරිස්ට් කාර්වල වැඩිපුරම දකින්නට ලැබෙන්නේ ලංකාවේ ඉන්න මිනිසුන්. පසුගිය වාරාන්තයේදී ලංකාවේ තිබෙන උසස්ම පාඨශාලාවකට මා ගියා, ළමයකු කැඳවාගෙන ඒමට. එසේ යන විට ළමයින් ගෙවලට කැඳවාගෙන යාම සඳහා ටුවරිස්ට් කාර් 7 ක් ඒ පාසලට ඇවිත් තිබුණා. එයින් පෙනෙන්නේ විශේෂයෙන්ම මේ කාර්වලින් ප්‍රයෝජනය ගන්නේ විදේශික යන් නොවන බවයි. නුවර පැත්තට ගියාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

සුදු මහත්වරුන් යන ටුවරිස්ට් කාර් එකක්, දෙකක් දකින්නට ලැබෙනවා. නමුත් කොළඹ තිබෙන ටුවරිස්ට් කාර් වලින් එහාට මෙහාට යන්නේ කොළඹ තිබෙන ලොකු කොම්පැනිවල අධ්‍යක්ෂ මහත්වරුන්, ඒ අයගේ භාර්යාවන් සහ ළමයින්.

මේ රටට ගෙන්වා තිබෙන ජීප් රථ, මිනිමෝක් රථ ආදිය කෘෂිකර්ම ව්‍යාපාරයට යොදවා ගන්නෙ නැතිව වෙන වෙන දේට යෙදුවාය කියා මීට පෙර ගරු කෘෂිකර්ම ඇමතිතුමා චෝදනාවක් නගා තිබෙනවා. මහනුවර, fපැන්සි හවුස් කියන ස්ථාන යේදී ජීප් රථයක් පෞද්ගලික ව්‍යාපාර වලට යොදාගෙන තිබී අසු වුණා. අන්න ඒ අන්දමට අද සංචාරක ව්‍යාපාරය සඳහා නොවෙයි, වෙනත් කටයුතුවලට මෙම මෝටර් රථ ප්‍රයෝජනයට ගන්නවා. නමුත් එය ඒ තරම් භයානක දෙයක් නොවෙයි. භයානක, මෙම සංචාරක ව්‍යාපාර වලට සම්බන්ධ වී සිටින ඇතැම් අධ්‍යක්ෂ වරුන් ගෙන යන ජාවාරම් නිසා අපේ විදේශ විනිමය විශාල වශයෙන් පිටරට ඇදී යාමයි. මේ කාරණය අපේ ඇමතිතුමා ගේ අවධානයට විශේෂයෙන්ම යොමු කරන්න කැමතියි. ගරු සභාපතිතුමනි, හෝටල් ව්‍යාපාරවල නියුක්ත අධ්‍යක්ෂ මණ්ඩල ගැන ගරු ඇමතිතුමා දන්නවා. ඔය අධ්‍යක්ෂ මණ්ඩලවල විදේශීය මෙන්ම ලාංකික අධ්‍යක්ෂවරුන් සිටිනවා. නමුත් ගරු ඇමතිතුමා මේ වන තෙක් සොයා බලා තිබෙනවාද, මෙම කොම්පැණිවල සම් බන්ධ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන්ට, අධ්‍යක්ෂ වරුන්ට, දේශීය මෙන්ම විදේශීය අධ්‍යක්ෂ වරුන්ට රන් පවුම්වලින් ගෙවනවාද, ඩොලර්වලින් ගෙවනවාද එහෙම නැති නම් රුපියල්වලින් ගෙවනවාද කියා ?.

මා පෞද්ගලික වශයෙන් දන්නවා, එක් කොම්පැනියකට සම්බන්ධ අධ්‍යක්ෂ වරයකු ගැන. නම් වශයෙන් හෙළිදරව් කිරීම සුදුසු නැති නිසා සඳහන් කරන්නෙ නැහැ. ව්‍යාපාරයට සම්බන්ධ වී ඇති එම අධ්‍යක්ෂවරයාට ගෙවන වැටුප මෙහි ඇති කොම්පැනියේ ශාඛාවෙන් ගෙවන්නේ නැතුව එංගලන්තයේ තිබෙන කොම්පැනි යෙහි තැන්පත් කරන්නටය කියා අධ්‍යක්ෂ මණ්ඩලය දැනට තීරණයක් ගෙන තිබෙනවා. මෙයින් සිදු වන්නේ කුමක්ද? මේ රටේ ධනය යොදා පවත්වා ගෙන යන ව්‍යාපාර වුණත්, ඒවායේ සිටින ස්වදේශිකයන්ට ලැබෙන මුදල් රන්පවුම්වලින් එහි තැන්පත් වෙනවා. එපමණක් නොවෙයි, ඔහුගේ හෝ ඇගේ නමට එසේ තැන්පත් කරන මුදල රුපි යල්වලින් නොවෙයි, පවුම්වලිනුයි තැන් පත් කරන්නේ. ලංකාවේ විදේශ විනිම යයි මේ සඳහා යෙදවෙන්නෙ.

ඔන්න ඔය අන්දමට ක්‍රමානුකූලව ගෙන යන වැඩ පිළිවෙළක එක් අංශයක් ගැන පමණයි මා සඳහන් කළේ. එම නිසා ගරු ඇමතිතුමා කල්පනා කරන්න ඕනෑ යම් නීතියක් ගෙනෙන්න, කොම්පැනිවල සිටින ස්වදේශීය අධ්‍යක්ෂවරුන්ට වැටුප් හෝ ලාභාංශ ගෙවිය යුත්තේ රුපියල් වලින් බවට. විදේශීය අධ්‍යක්ෂවරුන්ට හෝ ඔවුන්ට සම්බන්ධ වෙනත් අයට ලාභාංශ හෝ වැටුප් රන්පවුම්වලින් හෝ ගෙවීමට දැන් පවතින නීතිය යටතේ ඉඩ දී තිබෙනවා. එහෙත් ලාංකිකයන්ට ගෙවී මේදී රුපියල් වලින්ම ගෙවිය යුතු බවට නීතියක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඉන්දියාවත් සමග සම්බන්ධ වී ලංකාවේ දේශ සංචාරක ව්‍යාපාරය දියුණු කර ගන්න ඕනෑය කියන යෝජනාවක් තිබුණා. ඒ යෝජනාව ඉතාමත්ම වැදගත් එකක්. මා වැදගත් යයි විශේෂයෙන්ම සඳහන් කළේ, දැනට ලංකාව ලෝකයත් සමග ඇති කරගෙන තිබෙන සම්බන්ධතාවන් දිහා බැලුවාම, පෙරට වඩා ක්‍රම ක්‍රමයෙන් සම්බන්ධතා වන් අඩු වී යන බවක් පෙනී යන නිසයි. ලෝකය සමග නොයෙකුත් අන්දමින් සම්බන්ධකම් ඇති කර ගෙන යනවාය, වඩ වඩාත් තහවුරු කර ගැනීම පිණිස නොයෙකුත් පියවර ගන්නවාය, ලෝකය සමග කිට්ටු සම්බන්ධකම් ඇති වන අන්දමට නොයෙකුත් කටයුතුවලට සහභාගි වෙනවාය, ගමනාගමන පහසුකම් ඇති කර ගෙන යනවාය, ආදී දේවල් ගැන සඳහන් කළත් ක්‍රමානුකූලව පෙරට වඩා සම්බන්ධතාව අඩු වී යන බව නම් කනගාටුවෙන් නමුත් සඳහන් කළ යුතුව තිබෙනවා. සූවස් අර්බුදය නිසා මහමුහුදින් රටවල් සමග පැවති සම්බන්ධය බොහෝ දුරට අඩු වුණා, ඒ රටවල් ඈත් වුණා. මේ නිසා රටට පැමිණෙන නැව් පෙරට වඩා බොහෝ ප්‍රමාදවයි පැමිණෙන්නේ. මෙරටට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ද්‍රව්‍ය ගෙන එන නැව් බොහොමයක් ගැන බැලුවොත්, "සිංගප්පූරුව හරහා ලංකාවට" යනුවෙන් ඒවා හඳුන්වනවා. මෙයින් පැහැදිලි වෙනවා, මහමුහුදින් පවා අපේ රට හා ඇති සම්බන්ධකම් ක්‍රමානුකූලව ඇත් වන බව. ගරු ඇමතිතුමා අහසින් සම්බන්ධකම් වැඩි කර ගැනීමට උත්සාහ දරනවා. එසේ වුණත් ඔය තරම් විශාල ජම්බෝ ජෙට් යානා අපේ රටට එයිද, නැති නම් ලංකාවට උතුරින් පිහිටා ඇති ඉන්දියාවේ නගරවලට වඩ වඩා ඇදෙයිද කියා, ඒවාට වැඩි වැඩියෙන් සංචාරකයින් ඇදෙයිද කියා කල්පනා කර බලනවා නම් හොඳයි. ඇත්ත වශයෙන්ම එම ප්‍රශ්නයට දැන් අප මුහුණ දී තිබෙනවා. ඒ නිසා අනාගතයේ ලොකු පහරක් වැදේදැයි දන්නේ නෑ. එවැනි පහරක් වැදෙන්නට ඉඩ තිබෙනවා නම් එය වැළැක්වීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි. ඉන්දියාවත් ලංකාවත් අතර ගිවිසුමක් ඇති කොට ඉන්දියාවට එන සංචාරකයන් ලංකාවට ගෙන්වා ගැනීමට බැරිදැයි සොයා බැලිය යුතුයි. එංගලන්තයේ පොදු රාජ්‍ය මණ්ඩල කාර්යාලයේ ඉන්දියානු අංශයේ සේවය කරන මහතකුගෙන් ඒ පිළිබඳව දීර්ඝ රපෝර්තුවක් ගරු ඇමතිතුමාට ලැබී ඇතැයි මා හිතනවා. ඉන්දියාවත් ලංකාවත් එකට එකතු වී දේශ සංචාරක ව්‍යාපාරය දියුණු කළ යුතු බව කියැවෙන ඒ රපෝර්තුව දැන් ඇමතිතුමා ළඟ තිබෙනවාදැයි මා දන්නේ නැහැ. කෙසේ වුණත් එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකළහොත් නුදුරු අනාගතයේදී සංචාරකයන් විශාල පිරිසක් මේ රටට ඒදැයි සැක සහිතයි. ලංකාව දෙවැනි ඇතැන්ස් නගරයක් කරන බව මීට අවුරුදු දෙකකට පමණ පෙරදී ගරු රාජ්‍ය ඇමතිතුමා ආඩම්බරයෙන් ප්‍රකාශ කළා. ඇතැන්ස් නගරය නිසා දේශ සංචාරකයන්ගෙන් ඩොලර් කෝටි 10 ක් විතර ලැබෙන බව සඳහන් කළ එතුමා ඒ තත්ත්වය උදා කර ගන්නට අපට බැරිදැයි ප්‍රශ්න කළා. එහෙත් අපට කෝටි 3.2 කට වඩා ගන්නට බැරි බව ලෝක බැංකු වාර්තාව අනුව පෙනී යනැයි කියන්නට එතුමාට පසුව සිදු වුණා.

අප මේ යොදන මුදල්වලින් නිසි ප්‍රයෝජන ලැබෙනවාදැයි කල්පනා කරන්නට ඕනෑ. සංවර්ධනය සඳහා යම් මුදලක් යෙදුවහොත් ඊට සරිලන පොළියක්වත් ආපසු ලැබෙන්නට ඕනෑ. එහෙත් මේ ව්‍යාපාරය සම්බන්ධයෙන් නම් දැන් අපට ඒ පිළිබඳවත් සැකයක් ඇති වෙනවා. යොදවන මුදල් ප්‍රයෝජනවත් ආකාරයට යෙදවිය යුතුයි. විශාල මුදලක් යොදවන විට නියම ගුරුහරුකම් යටතේ පරීක්ෂාකාරීව එය යෙදවිය යුතුයි. මුදල් යෙදවීම සුදුසුද නැද්දැයි දැන උගත් අයගෙන් විමසා බැලිය යුතුයි. අන්න ඒ කාරණය පිළිබඳව කල්පනා කර බලා පරීක්ෂාකාරීව ක්‍රියා කරන ලෙස මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 3.55

**සභාපති**

*(அக்கிராசனர்)*

(The Chairman)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, உபசபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *took the Chair.*

**වර්නන් ජොන්ක්ලාස් මයා.** (පත්කරන ලද මන්ත්‍රී)

*(திரு. வி. ஜொங்கிளஸ்—நியமன அங்கத்தவர்)*

(Mr. V. Jonklaas—Appointed Member)

Mr. Chairman, I heard this morning that there is a proposal to exploit the Singha Raja Forest. As a person from the Sabaragamuwa Province the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) will realize what a terrible thing that will be. The Singha Raja forest is the only remaining primeval forest in Ceylon. It has a distinct endemic fauna, moths of every hue over one foot wide, and in living memory the black panther has been seen in that forest.

The reason for this proposal, I believe, is that the forest should be thinned. Now, one knows that this forest has stood for centuries. There

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෙන්ක්ලේ මයා.]

has been no thinning process except perhaps the thinning process of nature. It has withstood that. I have seen this thinning process in other forests. It is the cutting down of the biggest trees.

When you cut down in this forest the trees of primary growth, the forest will cease to be a primeval forest and its value to Ceylon both as a watershed for at least three rivers and as a forest which is visited by persons from abroad purely for the purpose of seeing it and walking in it examining it, will be lost.

If anyone walks in a forest of that kind, as I have done, he will realize how cool a tropical country can be. It is ice cool. You have to wear heavy clothing. You find peculiar kinds of moss.

Well, I do not want to speak too long about this forest. I want only to make the important point that if you start thinning the forest you damage secondary growth because these immense trees fall and secondary growth is destroyed.

Then, after the personnel of the Forest Department have gone away after doing their fell work come the illicit fellers and close behind them come the gemmers, and the primeval forest ceases to be.

It is a fact that we have to face that in the last 25 years our forests have been raped with the result that every year rainfall is less. Today there is a complete drought in Hambantota, Uva, the Eastern Province and the North-Central Province. In those areas there were magnificent forests. They were destroyed for various agricultural projects which today are dust. If the Sinharaja forest is in any way thinned, in the trail of this thinning it will dry the water table. That is what has happened in this country.

I have seen a forest in Ceylon, in the Gal Oya Valley, being cut down—great machines pushing it down, cutting down magnificent trees of the rarest woods. And what was done to that wood ? It was burnt. And what was left behind was just bare soil which, naturally, acre after acre, eroded into the sea. I have seen with my own eyes the effect it also had on lower paddy fields. The hon. Member for Pottuvil (Mr. M. A. Abdul Majeed) has told us about this : how acres of magnificent paddy were destroyed.

I appeal to the Hon. Minister who, I know, is interested in fauna and flora, to do his best to prevent the destruction of one of Ceylon's precious possessions.

* * * *

---

[ඉතිරි වැඩ කටයුතු මෙදින නිල වාර්තාවේ II වන කොටසින් බලා ගත යුතුයි.]

[நிகழ்ச்சித் தொடர்ச்சியை இன்றைய அதிகார அறிக்கை (பகுதி II) இல் பார்க்க]

[*For continuation of Proceedings, see* OFFICIAL REPORT *for this Day (Part II)*.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org